# රාජ්‍ය දැව සංස්ථාව

# 2018
# වාර්ෂික වාර්තාව

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

50 1968 - 2018 සංවත්සරය Anniversary
රාජ්‍ය දැව සංස්ථාව • STATE TIMBER CORPORATION

# රාජ්‍ය දැව සංස්ථාව

# වාර්ෂික වාර්තාව 2018

දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය

50

1968 - 2018

සංවත්සරය

Anniversary

රාජ්‍ය දැව සංස්ථාව • STATE TIMBER CORPORATION



# අඩ සියවසක ගමන් මග

50 1968 - 2018 සංවත්සරය Anniversary
රාජ්‍ය දැව සංස්ථාව • STATE TIMBER CORPORATION

50 1968 - 2018 සංවත්සරය Anniversary

රාජ්‍ය දැව සංස්ථාව • STATE TIMBER CORPORATION

## අපේ හෙට දින

### දැක්ම

ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව වෙළඳපොළෙහි සැබෑ නායකත්වය ඉසිලීම

### මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම, කීර්තිනාමය හා නිපුනතාවය උපයෝගී කරගනිමින් නීත්‍යානුකූලව, පරිසර හිතකාමී අන්දමින් ජාතික අවශ්‍යතාවය අනුව අපගේ ගැනුම්කරුවන්ගේ දැව සහ දැවමය භාණ්ඩ ඉල්ලීම නිෂ්පාදනය කර ලබාදීම



# අඩ සියවසක ගමන් මඟ



රාජ්‍ය දැව සංස්ථාව යන නම දකින ඕනෑම අයෙකුට දැව සමඟ පවතින සම්බන්ධතාවය මනාව හඳුනාගත හැකිය. වසර 50ක පළපුරුද්දක් හා කැපවීමක් ඇතිව රටට සහ එහි ආදරණීය සේවකයින්ට කරන ලද සේවය මෙපමණයැයි කිව නොහැකිය. පනස් වසරක අත්දැකීම් සමඟ ශ්‍රී ලංකා රජයට බරක් නොවී තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යනු ලබන්නේ අනෙකුත් රාජ්‍ය ආයතනවලට මනා ආදර්ශයක් සපයමිනි.

සංස්ථාවේ කළමනාකරණය මෙන්ම සියලුම සේවකයින් දැක්වූ දායකත්වය නිසා විවිධ බාධක හා අභියෝග හමුවේ ජයග්‍රහණයන් කරා ගමන් කිරීමට අවස්ථාව ලැබුණු බව මහත් අභිමානයෙන් ප්‍රකාශ කළ යුතුමය. මූලික අරමුණු අතර අපගේ වටිනා ම සම්පත වන “ගස්” වඩාත් වගකිව යුතු හා පරිසර හිතකාමී ලෙස කපා ඉවත් කිරීම හා නව මෝස්තර හා හැඩතල හඳුන්වා දෙමින් ජනතාවගේ දැව අවශ්‍යතා සපුරාලීම සඳහා ලබාගත් දැව උපරිම ලෙස භාවිතා කිරීම දැක්විය හැකිය.

රාජ්‍ය දැව සංස්ථාව සිය 50 වන සංවත්සරය සමරමින් මේ මොහොතේ තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් රටට වඩාත් ඵලදායී සේවයක් ලබාදීම අධිෂ්ඨාන කරගෙන සිටී. අපි තවත් චිරාත් කාලයක් ජනතාවට මෙන්ම රටට සේවය කිරීමේ අදිටනින් යුතුව ගමන් කරන්නෙමු.

## පටුන


| | |
|---|---|
| ස්වර්ණ ජයන්ති සැමරුම් සාඩම්බර මතකයන් | 07-09 |
| ආරම්භය සහ අද අපි | 10-11 |
| මූල්‍ය ප්‍රකාශන උද්ධෘත | 12 |
| සම්මාන සහ ඇගයීම් | 13 |
| ආයතනික තොරතුරු | 14 |
| කළමනාකරණ මඬුල්ල | 15-17 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 18-21 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය | 22-25 |
| අපගේ කාර්යභාරයන් හා අපගේ ව්‍යාපාරික වටිනාකම් | 26-27 |
| අධ්‍යක්ෂක මණ්ඩලය | 28 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල | 29 |
| අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය | 30-35 |
| අපගේ ආවරණ කලාප | 36-40 |
| විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 41 |
| ව්‍යාපාරික සාරාංශය | 42-46 |
| දශකයක තොරතුරු | 47 |
| අවදානම් කළමනාකරණය | 48-52 |
| ආයතනික සමාජ වගකීම | 53-56 |
| විගණකාධිපතිගේ වාර්තාව | 57-67 |
| වාර්ෂික ගිණුම් | 68-92 |
| මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව | 93 |


# ස්වර්ණ ජයන්ති සැමරුම් සාඩම්බර මතකයන්




50 1968 - 2018
සංවත්සරය
Anniversary
රාජ්‍ය දැව සංස්ථාව • STATE TIMBER CORPORATION



## ආරම්භය...

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968.04.04 දිනැති හා අංක 14796 දරණ ගැසට් පත්‍රය මගින් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1969 නොවැම්බර් 7 දිනැති අංක 14879 දරණ ගැසට් පත්‍රය, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 අති විශේෂ ගැසට් නිවේදනය, 2001 වර්ෂයේ ජුනි 26 දිනැති අංක 1190/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ 2008 පෙබරවාරි 25 දිනැති අංක 1538/7 දරණ ගැසට් පත්‍ර අනුව අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5කි.


## අද අපි...


ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල““සම්පත්පාය"" පරිශ්‍රයෙහි පිහිටුවා ඇති අතර, ප්‍රාදේශීය ඒකක උප කාර්යාල දීප ව්‍යාප්තව ස්ථානගත කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ මූලික ආදායම් ප්‍රභවය දැව හා දැවමය නිෂ්පාදන අලෙවිය වන අතර, තිරසාර අස්වැන්නක් උදෙසා රාජ්‍ය දැව සංස්ථාව, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව තිරසාර වනාන්තර වැඩසටහන් ක්‍රමය ක්‍රියාවට නංවනු ලබයි.


ඉතා උසස් තත්වයේ දැව නිෂ්පාදන හා විශිෂ්ඨ සේවාවක් සැපයීමට අප නිරතුරු උත්සුක වන අතර ඉකුත් වසර 50 ක් මුළුල්ලේ රාජ්‍ය දැව සංස්ථාව දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ ඉහළින් වැජඹීමට මෙය හේතු සාධක වූ අතර, ඉහළ ශ්‍රේණියේ නිෂ්පාදන ඇගයීමේදී අපගේ නිෂ්පාදන පිළිගත් සාධනීය සලකුණක් ලෙස හාවිතයට පත්ව ඇත.


# මූල්‍ය ප්‍රකාශන උද්ධෘත


| දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා | | 2018 | 2017 | වෙනස % |
|---|---|---|---|---|
| **ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | | |
| අයභාරය | Rs. '000 | 4,069,020 | 4,253,774 | -4% |
| භාණ්ඩාගාර හා ආදායම් බදුවලට පෙර ලාභය | Rs. '000 | 672,433 | 966,804 | -30% |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | Rs. '000 | 100,000 | 100,000 | 0% |
| ආදායම් බදු | Rs. '000 | 250,372 | 301,063 | -17% |
| වර්ෂය සඳහා විස්තීරණ ආදායම් | Rs. '000 | 429,662 | 242,328 | 77% |
| ස්කන්ධය මත ඉපැයීම් | % | 9.2 | 5.7 | 61% |
| වත්කම් මත ඉපැයීම් | % | 6.6 | 3.8 | 72% |
| **මූල්‍ය පත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | | |
| මුළු වත්කම් | Rs. '000 | 6,520,465 | 6,317,702 | 3% |
| මුළු ස්කන්ධය | Rs. '000 | 4,660,357 | 4,230,694 | 10% |
| මුළු ණයහිමියන් | Rs. '000 | 1,860,109 | 2,087,008 | -11% |
| ණය/ස්කන්ධ | % | 40 | 49 | -19% |
| ණය/මුළු වත්කම් | % | 29 | 33 | -14% |
| **වෙනත් තොරතුරු** | | | | |
| මුළු සේවකයන් | No. | 2,001 | 2,083 | -4% |
| එක් සේවකයකුට අයභාරය | Rs. '000 | 2,033 | 2,042 | -0.4% |
| එක් සේවකයකුට ලාභය (භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර) | Rs. '000 | 336 | 464 | -28% |




# සම්මාන සහ ඇගයීම්

2018



ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් පවත්වන ලද ජාතික ව්‍යාපාර විශිෂ්ටත්ව සම්මාන උළෙලේ දී 2018 වසර සඳහා "නිෂ්පාදන - රාජ්‍ය අංශය" වර්ගීකරණය යටතේ රන් සම්මානයෙන් රාජ්‍ය දැව සංස්ථාව පිදුම් ලැබීය.

2017



2016



2017 සහ 2016 වර්ෂවල අඛණ්ඩව ජාතික ව්‍යාපාර විශිෂ්ටත්ව සම්මාන උළෙලේ දී "නිෂ්පාදන - රාජ්‍ය අංශය" වෙනුවෙන් රන් සම්මානය රාජ්‍ය දැව සංස්ථාව හිමි කර ගන්නා ලදී.



- හරිත මැකෝ සම්මානය 2008 - ශ්‍රී ලංකා ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
- වන හා පරිසර අධ්‍යාපනයට වූ දායකත්වය වෙනුවෙන් සම්භාවනා හා ඇගයීම් මැකෝ සම්මානය
- 2009 "දැයට කිරුළ" ප්‍රදර්ශනයේ දී වඩාත් නිර්මාණශීලී ප්‍රදර්ශන කුටිය සඳහා සම්මානය.



2012



2013

ජාතික වාණිජ මණ්ඩලය මඟින් 2012 සහ 2013 දී පැවැත්වූ ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළෙලේදී රාජ්‍ය අංශයේ නිෂ්පාදන ආයතන අතරින් නිෂ්පාදනය වෙනුවෙන් කුසලතා සම්මාන හිමි කර ගන්නා ලදී.



2009 2010 2011

ජාතික වාණිජ මණ්ඩලය පිරිනමන රන් සම්මානයෙන් අඛණ්ඩව 2009, 2010 සහ 2011 වසර තුළදී රාජ්‍ය දැව සංස්ථාව පිදුම් ලබන ලදී.



2009 2010 2011



ජාතික වාණිජ මණ්ඩලය මඟින් 2014 දී පැවැත්වූ ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළෙලේදී රාජ්‍ය අංශයේ නිෂ්පාදන ආයතන අතරින් නිෂ්පාදනය වෙනුවෙන් රිදී සම්මානයෙන් පිදුම් ලබන ලදී.

# ආයතනික තොරතුරු - 2018

**අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා** - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා
**අජිත් මාන්නප්පෙරුම මහතා** - මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා
**අනුර දිසානායක මහතා** - ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය

## අධ්‍යක්ෂ මණ්ඩලය - 2018

කේ.ඩබ්. ශාන්ත බණ්ඩාර - **සභාපති** - රාජ්‍ය දැව සංස්ථාව
එච්.වයි.ටී. පවරකුමාර මහතා - **ක්‍රියාකාරී අධ්‍යක්ෂ** - රාජ්‍ය දැව සංස්ථාව
ඩී. විජේසිරිවර්ධන මහතා - **අධ්‍යක්ෂක** (භාණ්ඩාගාර නියෝජිත)
එස්.ඒ.ඒ. සතුරුසිංහ මහතා - **අධ්‍යක්ෂක** (වන සංරක්ෂණ ජනරාල්)
එම්.වී. කරුණාරත්න මහතා - **අධ්‍යක්ෂක**
ටී.පී. රන්ජන් ප්‍රනාන්දු මහතා - **අධ්‍යක්ෂක**
ඒ.එම්.සී. පෙරේරා මහතා - **අධ්‍යක්ෂක**

ආචාර්ය එන්.ඩී.රුවන්පතිරණ - **සාමාන්‍යාධිකාරී,** රාජ්‍ය දැව සංස්ථාව

## විගණන හා කළමනාකරණ කමිටුව

ඩී. විජේසිරිවර්ධන මහතා - කමිටු සභාපති
එස්.ඒ.ඒ. සතුරුසිංහ මහතා - කමිටු සාමාජික
එම්.වී. කරුණාරත්න මහතා - කමිටු සාමාජික

## විගණක

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

## ප්‍රධාන බැංකුව

ලංකා බැංකුව

## මුදල් වර්ෂය

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා
දුරකථන : +94 11 2 866 600-5
ෆැක්ස් : +94 11 2 866 623
වෙබ් අඩවිය : www.timco.lk



# කළමනාකරණ මඩුල්ල - 2018

| | | |
|---|---|---|
| සාමාන්‍යාධිකාරී | ආචාර්ය එන්.ඩී.රුවන්පතිරණ | PhD (Forestry), M.Sc. (Forestry), B.Sc. |
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්** | | |
| නි.සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) | ඩබ්.ඩබ්.එම්.ජේ.කුරේ මිය | FCA |
| නි.සාමාන්‍යාධිකාරී (මුදල්) | ජී.ඩී.එස්.කුමාරසිංහ මයා | MBA, B.Sc(Acct.Fin. Mgr), ACA, ACMA |
| නි.සාමාන්‍යාධිකාරී(මානව සම්පත් හා පාලන) | එම්.ඒ.සී.එන්.සමරසිංහ මයා | MPM, B.Sc (Business studies) Ad.Dip in Mgt. and Admin. |
| නි.සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) | එම්.සී.දේවේන්ද්‍ර මයා | M.Sc. (Forestry), B.sc |
| නි.සාමාන්‍යාධිකාරී (අලෙවි) (වැ/ආ) | ඩබ්.බී.සමන්ත මයා | M.Sc.(Forestry), B.Sc. N. Dip.Teaching |
| නි.සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු හා නිෂ්පාදන) (වැ/ආ) | ජී.ජී.තිසර ගමගේ මයා | B.Sc. |
| **සහකාර සාමාන්‍යාධිකාරීන්** | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (කලාප) | පී.කේ.අජිත් චන්දන මයා | B.Sc. |
| සහකාර සාමාන්‍යාධිකාරී (කලාප) | එච්.බී.රජවත්ත මයා | BA |
| **කළමනාකරුවන්** | | |
| කළමනාකාර (පාලන) | ඒ.ජී.එච්.කුලරත්න මයා | M.LRHRM,PgD. LRHRM,PQHRM,Dip. in Mgt,Dip. in For-estry,Dip.in English, AMCIPM, ACPM |
| කළමනාකාර (පර්යේෂණ හා පුහුණු) | සි.කේ.මුතුමාල මයා | M.Sc.(Forestry), B.Sc. (Agri:) Hons. |
| කළමනාකාර (මුදල්) | පී.ඩී.ඒ.එම්.ඩී.වික්‍රමසිංහ මයා | Dip. (F.A) |
| කළමනාකාර (මුදල්) | පී.ටී.එන්.බෝවත්ත මිය | |
| කළමනාකාර (මුදල්) | කේ.ඩී.කේ.සී. ද සිල්වා මිය | |
| කළමනාකාර (මුදල්) | එච්.ජී.ආර්.විජේනායක මයා | |
| කළමනාකාර (අභ්‍යන්තර විගණන) | එච්.එම්.එස්.මාධව මයා | B.Com (Sp) |
| කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු) | ඒ.කේ.ලසිත එඩ්මන්ඩ් මයා | B.Sc.(Engineering) |
| කළමනාකාර (මිළදීගැනීම් හා නාවුක) | ටී.අරුණ ද සිල්වා මයා | |
| කළමනාකාර (තොරතුරු තාක්‍ෂණ) | ඒ.ජී.මාදුවගේ මයා | |
| කළමනාකාර (ආරක්‍ෂක) | චමින්ද වීරමන් මයා | |
| කළමනාකාර (සිල්පර හා විදුලිකණු) | ඩී.එම්.පුෂ්පකුමාර නිල්මිණී මයා | B.Sc. |

| ප්‍රාදේශීය කළමනාකරුවන් | | |
|---|---|---|
| ප්‍රාදේශීය කළමනාකාර (ප්‍ර.කාර්යාලය) | ආර්.විජේතුංග මයා | B.Sc.(Agri.)Sp |
| ප්‍රාදේශීය කළමනාකාර (ප්‍ර.කාර්යාලය) | එම්.ඩී.සී.සම්පත් මයා | BA |
| ප්‍රාදේශීය කළමනාකාර (කොළඹ) | එච්.පී.එස්.දිසානායක මයා | BA |
| ප්‍රාදේශීය කළමනාකාර (මොණරාගල) | එම්.කේ.ජී.වසන්තරාජ් මයා | |
| ප්‍රාදේශීය කළමනාකාර (අනුරාධපුර) | එච්.එල්.නන්දන මයා | B.Sc. |
| ප්‍රාදේශීය කළමනාකාර (අම්පාර) | යූ.පී.එච්.උළුවඩුගේ මයා | B.Sc. |
| ප්‍රාදේශීය කළමනාකාර (රත්නපුර) | ඩී.එච්.රාජපක්ෂ මයා | M.Sc.(Forestry),B.Sc. |
| ප්‍රාදේශීය කළමනාකාර (නුවර) | ඊ.එම්.එස්.ඒකනායක මයා | |
| ප්‍රදේශීය කළමනාකාර (යාපනය) | එස්. ස්කන්ධරාජා මයා | |
| ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල) | යූ.එස්.එම්.ප්‍රනාන්දු මයා | BA (Sp) |
| ප්‍රාදේශීය කළමනාකාර (මාතර) | ඩබ්.අයි.සාරංග මයා | B.Sc.(Hon.) |
| ප්‍රාදේශීය කළමනාකාර (නුවරඑළිය) | ඩී.ඒ.හෙන්ද්‍රාවිතාරණ මයා | |
| ප්‍රාදේශීය කළමනාකාර (බණ්ඩාරවෙල) | සුනිල් ජයරත්න මයා | |
| ප්‍රාදේශීය කළමනාකාර (මින්නේරිය) | එල්.එස්.ජයසේකර මයා | |

| නියෝජ්‍ය කළමනාකරුවන් | | |
|---|---|---|
| නියෝජ්‍ය කළමනාකාර (නීති) | කේ.අයි.ඩී.පී.කාරියවසම් මිය | LLB, Attorney at Law |
| නියෝජ්‍ය කළමනාකාර (නිර්මාණ හා තත්ව පාලක) | ඊ.එම්.එම්.ප්‍රනාන්දු මිය | |
| පද්ධති විශ්ලේෂක | ඩබ්.එච්.ඒ.චන්ද්‍රකුමාර මයා | B.Sc. |
| පද්ධති විශ්ලේෂක | ජේ.එම්.එම්.බී.ජයසුන්දර මයා | B.Sc. (Sp) Hon. |
| නියෝජ්‍ය කළමනාකාර(මානව සම්පත්) | එච්.පී.පෙරේරා මිය | |
| නියෝජ්‍ය කළමනාකාර(මානව සම්පත්) | කේ.එස්.අබේනායක මිය | |
| නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - බූස්ස | යූ.එස්.මඩවල මයා | HNDA, MAAT |
| නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - නුවර | එච්.එම්.පී.බී.හේරත් මයා | MBA, FABA, HNDA, PgD |
| නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - බූස්ස | ඒ.එල්.ඩබ්.තුෂාරි ද සිල්වා මෙනවිය | HNDA, MAAT |
| නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - නුවරඑළිය | එන්.ටී.එස්.කේ.පී.තිලකවර්ධන මයා | HNDA, MAAT |
| නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - යාපනය | ඩබ්.එම්.ජී.එම්.විජේසිංහ මයා | B.Sc.(Bus.Admin.) MAAT. |
| නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - මොණරාගල | ඒ.ජේ.පුෂ්පකුමාර මයා | B.Sc.(Bus.Admin) |
| නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - මින්නේරිය | එම්.ඩී.පී.එම්.දිසානායක මයා | B.Sc.(Acc) |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - (ප්‍ර.කා) | ඩී.එන්.විජේසූරිය මිය | B.Sc.(Acc), CTA |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - (ප්‍ර.කා) | එස්.විතානගේ මිය | |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - අනුරාධපුර | ඩබ්.කේ.ජයසිංහ මිය | |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - කොළඹ | එස්.පී.ඒ.ජේ.සී.සමරකෝන් මයා | B.Sc.(Finance) |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - බණ්ඩාරවෙල | එස්.එම්.හේවගේ මයා | B.BA(Bus.Econ.) |
| නියෝජ්‍ය කළමනාකාාර (මුදල්) - කල්දෙමුල්ල | ඩබ්.ඒ.එල්.එස්.පෙරේරා මයා | |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - කුරුණෑගල | එස්.එච්.අයි.ප්‍රසාද් මයා | B.BA(Bus.Econ.) |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - යාපනය | ඩී.කේ.ජී.ජී.පුෂ්පකුමාර මයා | B.Com. |
| නියෝජ්‍ය කළමනාකාර (අලෙවි) | ඩබ්.ඩී.ඒ.එස්.තිලකරත්න මයා | |
| නියෝජ්‍ය කළමනාකාර (දැව ශ්‍රේණි කිරීම්) | ඩී.පී.කේ.එස්.ජී.සමරවික්‍රම මයා | B.Sc.(Mkt.Mgt.) |
| නියෝජ්‍ය කළමනාකාර (දැව සැපයුම්) | බී.ඒ.නලින් දේශප්‍රිය මයා | |
| නියෝජ්‍ය කළමනාකාර (ගෘ.භා.නිර්මාණ) | එච්.එම්.ටී.එස්.අබේරත්න මිය | B.Desi. (Hon.) MBA in MOT |
| නියෝජ්‍ය කළමනාකාර (දැව ඉරුම්හල්) | එම්.පී.එන්.අරුණ ශාන්ත මයා | B.Sc.(Bus.Admin.) |
| නියෝජ්‍ය කළමනාකාර (විමර්ශන) | එස්.ඒ.ඩී.නිරෝෂන් මයා | B.Sc.(Bus.Mgt.) |

| ගෘහභාණ්ඩ සංකීර්ණ නියෝජ්‍ය කළමණාකරුවන් | | |
|---|---|---|
| නියෝජ්‍ය කළමනාකාර (ගෘ.භා.සංකීර්ණ) වැ/ආ අම්පාර | එන්.පී.එස්.ඩබ්.ජයරත්න මයා | |
| නියෝජ්‍ය කළමනාකාර (ගෘ.භා.සංකීර්ණ) - කල්දෙමුල්ල | එච්.එම්.යූ.පී.සෝමවීර මයා | BLE, Dip. IT & M |
| නියෝජ්‍ය කළමනාකාර (ගෘ.භා.සංකීර්ණ) - බූස්ස | ආර්.එස්.පල්ලියගේ මයා | B.Sc.(Bus.Admin) |

| නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරුවන් | | |
|---|---|---|
| නි.ප්‍රාදේශීය කළමනාකාර (බණ්ඩාරවෙල) | අයි.පී.ලියනගේ මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (නුවරඑළිය) | ඩබ්.ඩී.පී.ජී.ජයසේකර මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (මින්නේරිය) | කේ.එම්.පී.ටී.සී.කපිලරත්න මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (මින්නේරිය) | යූ.ජේ.ජී.ඒකනායක මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (නුවර) | ආර්.සී.සමන් කුමාර මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (නුවර) | ඩබ්.ඒ.එස්.විජේසේකර මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (යාපනය) | ටී.පී.රමේෂ් මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (රත්නපුර) | එච්.ඒ.ගාමිණී අල්විස් මයා | |
| නි.ප්‍රදේශීය කළමනාකාර (මොණරාගල) | එස්.සී.ජයමාන්න මයා | B.Sc. |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (කැප්පෙටිපොළ) | ඩී.එල්.අබේනායක මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (මාතර) | කේ.චන්ද්‍රසේන මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (අනුරාධපුර) | එම්.ඩබ්.ඩබ්.බී.මුදන්නායක මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (කොළඹ) | ඊ.එම්.ඒ.කේ.එදිරිසිංහ මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (අම්පාර) | පී.හෙට්ටිආරච්චි මයා | B.Sc. |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල) | එස්.ඒ.මනෝජ් තුෂාර මයා | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල) | ආර්.පී.පී.ඩී.ජයසිංහ මයා | |



# සභාපතිතුමාගේ **සමාලෝචනය**

අපි අඛණ්ඩව අපගේ ආර්ථික කාර්යසාධනය ශක්තිමත් කිරීමට සහ අපගේ සියලු ව්‍යාපාර ක්‍රියාවලීන් හි කාර්යක්‍ෂමතාව වැඩි කිරීමට කටයුතු කළෙමු. ඒ අතරම, අපි නැවත වරක් අපගේ පාරිසරික හා සමාජ සංස්කෘතික කාර්ය සාධනය ඉහළ මට්ටමකින් පුළුල් කළෙමු. තිරසාර සංවර්ධනය පිළිබඳ මනා දැනුමකින් යුතුව එමෙන්ම, තිරසාර භාවිතයන් පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කිරීම අපගේ අරමුණයි.

රාජ්‍ය දැව සංස්ථාව තිරසාර ජයග්‍රහණය සදහා 2018 වර්ෂය තුළ දී වෙනත් වසර හා සසඳා බැලීමේදී පියවර රැසක් ඉදිරියට තබා ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති වශයෙන්, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් වාර්ෂික වාර්තාව සහ රාජ්‍ය දැව සංස්ථාවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබට ඉදිරිපත් කරනුයේ හදපිරි සතුටිනි.

පනස්වසරක ගමන් මග දෙස බැලීමේ දී බාධක කම්කටොළු මතින් මේ ගමන සාර්ථකව පැමිණීම පිළිබඳ ඇත්තේ ඉමහත් ආඩම්බරයකි. ලෝකයේ සහ ලංකාවේ ආර්ථික සහ දේශපාලනික තත්ත්වය පිළිබඳ සලකා බැලීමේදී රාජ්‍ය දැව සංස්ථාවේ සාර්ථකත්වය රටේ සමස්ත රාජ්‍ය ආයතනවලට ආදර්ශයක් බව කිව යුතුය. සලකා බලන වර්ෂය අප සංස්ථාවට ඉතා අපහසු වර්ෂයක් වුවත්, කෙසේ හෝ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මෙන්ම කළමනාකාරිත්වය ප්‍රමුඛ සමස්ත සේවකයන්ගේම කැපවීමත්, විශ්වාසයත් නොපසුබට උත්සාහයත් 2018 වර්ෂය සාර්ථකත්වයට මගපාදන ලදී. ශ්‍රී ලංකා රජය පාරිසරික හේතූන් මත අවස්ථානුකූලව ගනු ලබන තීන්දු තීරණ බොහෝ විට සංස්ථාවේ ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපෑම් එල්ල කරන ලදී. 2018 වර්ෂය යනු දශක 5ක සැමරුම් සමඟ නව පරිච්ඡේදයක ආරම්භය සනිටුහන් වන වසරකි.

වඩාත් විශ්වාසදායක හා ගුණාත්මක දැව නිෂ්පාදන ලබාදීමෙන් දැව කර්මාන්තයේ විශාල කාර්යභාරයක් ඉටුකිරීමට රාජ්‍ය දැව සංස්ථාව සෑමවිටම උත්සාහ කරයි. අපි අඛණ්ඩව අපගේ ආර්ථික කාර්යසාධනය ශක්තිමත් කිරීමට සහ අපගේ සියලු ව්‍යාපාර ක්‍රියාවලීන් හි කාර්යක්‍ෂමතාව වැඩි කිරීමට කටයුතු කළෙමු. ඒ අතරම, අපි නැවත වරක් අපගේ පාරිසරික හා සමාජ සංස්කෘතික කාර්ය සාධනය ඉහළ මට්ටමකින් පුළුල් කළෙමු. තිරසාර සංවර්ධනය පිළිබඳ මනා දැනුමකින් යුතුව එමෙන්ම, තිරසාර භාවිතයන් පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කිරීම අපගේ අරමුණයි.


සංස්ථාවේ වටිනාම සම්පත මානව සම්පත බව අපගේ විශ්වාසයයි. සංස්ථාවේ ඉලක්ක සපුරා ගනිමින් අපගේ ගනුදෙනුකරුවන්ට හැකි උපරිම මට්ටමින් සේවය කිරීමට කැපවී සිටින සේවකයින්ගේ කුසලතා සහ නිපුණතා වැඩි දියුණු කිරීම අරමුණු කරගත් පුහුණු හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් 2018 දී අපගේ කාර්ය මණ්ඩලය සඳහා ලබාදීමට අයවැය තුළින් ප්‍රතිපාදන වෙන්කර ලබාදුනි. රාජ්‍ය අංශයේ හොඳම නිෂ්පාදන අංශය සඳහා ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේදී රන් සම්මානය දිනාගැනීම සඳහා 2018 වර්ෂය අප ලද සාර්ථකත්වයට හා අපගේ කැපවීමට මනා සාක්ෂියකි.

අප විසින් ප්‍රතිෂ්ඨාපිත පාලන ප්‍රමිතීන් හා ව්‍යවසායකත්ව කුසලතා අනුගමනය කිරීමෙන් කාර්යසාධනය වැඩිදියුණු කිරීමට අපට හැකි විය. තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පයට අනුකූලව, වගකිව යුතු ආයතනික පුරවැසියෙකු ලෙස, රාජ්‍ය දැව සංස්ථාව යටතේ පිහිටුවා ඇති විශේෂ ඒකකයක් හරහා ක්‍රියාත්මක වන "තුරුජන සිසු බැංකු" රුක් රෝපණ වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙම වසරේදී ද අවස්ථාව උදා විය. සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන තවාන් පැළ 130000ක් පමණ අප විසින් නිෂ්පාදනය කර "වනරෝපා" වැඩසටහන යටතේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන සහ පාසැල් අතර නොමිලේ බෙදාහරින ලදී. රාජ්‍ය දැව සංස්ථාවේ 50 වන සංවත්සරය වෙනුවෙන් සංවිධානය කරන ලද සමගාමී වැඩසටහන් අතර, විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන සංස්ථා සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම විශේෂ අවස්ථාවක් ලෙස සැලකිය හැක.


## මූල්‍ය කාර්යසාධනය




ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වර්ෂය තුළදී 3.2%ක වර්ධන වේගයක් වාර්තා කළ අතර, අනෙක් අංශ හා සලකා බැලීමේදී මෙම වර්ධනයට කර්මාන්ත අංශය අඩු ප්‍රතිශතයකින් දායක වී ඇත. කෙසේ වෙතත්, මෙවැනි පසුබිමක් යටතේ රු.මිලියන 4,069ක පිරිවැටුමක් 2018 මුදල් වර්ෂය තුළ ලබාගත් අතර, පෙර වර්ෂයේ එය රු.මිලියන 4,253කි. විකුණුම් ආදායමේ පහළ බැසීමක් වාර්තා වුවද, සලකා බලන වර්ෂය තුළදී රු.මිලියන 672ක භාණ්ඩාගාර බදු හා ආදායම් බදු පෙර ලාභයක් සහ රු.මිලියන 322ක ආදායම් බදු පසු ලාභයක් වාර්තා කිරීමට හැකිවිය. 2017 වර්ෂයට සාපේක්ෂව භාණ්ඩාගාර බදු හා ආදායම් බදු පෙර ලාභය සහ ආදායම් බදු ගෙවීමෙන් පසු ලාභය පිළිවෙළින් 31% සහ 43% කින් අඩුවිය.




වත්කම් මත ප්‍රතිලාභ යනු සංස්ථාව එහි මුළු වත්කම් හා සම්බන්ධව කෙතරම් ලාභදායී ද යන්න පිළිබඳ දර්ශකයකි. 2018 දී එය 4.9%ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 4.5%ක අඩුවීමකි. පෙර වර්ෂයට සාපේක්ෂව විකුණුම් ආදායම් අඩුවීමත් සමඟ පරිපාලන සහ විකුණුම් හා බෙදාහැරීමේ වියදම්වල ඉහළ යෑම ශුද්ධ ලාභයේ අඩුවීමට හේතු වී ඇත. කෙසේ වෙතත්, ජාතික ආර්ථිකයට බදු ගෙවීම්, ස්කන්ධභාග ගෙවීම් සහ විශේෂ භාණ්ඩාගාර බදු ලෙස රු.මිලියන 2199 ක දායකත්වයක් ලබාදීමට සංස්ථාවට හැකි විය. ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය 6.9% වූ අතර එම අගය පෙර වර්ෂයට සාපේක්ෂව 48% අඩුවීමකි. සංස්ථාවේ ප්‍රධාන කොටස්හිමියා වන්නේ ශ්‍රී ලංකා රජයයි. පසුගිය වසර කිහිපය තුළ ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතිකය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට සංස්ථාවට හැකි විය. ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ වසරින් වසර වර්ධනය වී ඇති අතර සංස්ථාවට සිය වැඩි කළ ප්‍රාග්ධනය, වැඩි ලාභ උපයාගැනීම සඳහා විශාල ලෙස ප්‍රාග්ධන ආයෝජන සඳහා යෙදවීමට අවස්ථාව සැලසුනි.




## ඉදිරි අරමුණු

දැව කර්මාන්තයේ දියුණුව සඳහා විශාල දායකත්වයක් ලබාදීමටත් එහි ක්‍රියාකාරකම් නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් විශිෂ්ට ප්‍රතිඵල ලබාගැනීමටත් රාජ්‍ය දැව සංස්ථාවට හැකි වී තිබේ. ඒ අනුව, තරඟකාරී වාසි ලබාගැනීම, ගුණාත්මක දැව නිෂ්පාදනය කිරීම සඳහාත් පාරිභෝගිකයින්ට තෝරා ගැනීම සඳහාත් විවිධ වූ නිෂ්පාදන හඳුන්වාදීමත් අරමුණු කරගනිමින් ප්‍රාග්ධන ආයෝජන පුළුල්කිරීම හරහා නව තාක්ෂණයන් සහ නවතම අලෙවිකරණ උපායමාර්ග හඳුන්වා දෙමින් ඉදිරි වර්ෂවල කටයුතු කිරීම සඳහා සැලසුම් දැනටමත් සකස් කර ඇත.

අපගේ වත්කම් පදනමේ ශක්තිමත් බව වැඩිදියුණු කිරීම සඳහා අපගේ ආයෝජන ප්‍රවේශයන් විවිධාංගීකරණය කිරීම සහ අපගේ ප්‍රාග්ධන ව්‍යුහයේ ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමුකිරීම තුළින් අපගේ ඉලක්කවලට අනුකූලව විශිෂ්ට ප්‍රතිඵල ලබාදීමේ උපායමාර්ග අප විසින් වර්ධනය කරනු ඇති අතර, ඒ සියල්ල කෙටි හා මධ්‍යකාලීන වර්ධනය වේගවත් කරනු ඇත.

අද වනවිට රාජ්‍ය දැව සංස්ථාව අභියෝගයන්ට හොඳින් සූදානම්ව සිටින අතර, වෙළෙඳපොළ කොටස පුළුල් කරගැනීමට සහ එහි මූලික ව්‍යාපාරය වර්ධනය කිරීමට ඇති අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගන්නා බව මට විශ්වාසයි. ආයතනය මගින් තවදුරටත් නවෝත්පාදන බිහිකිරීමටත්, නවීන තාක්ෂණය තුළින් සම්පත් නාස්තිය අවම කිරීමත්, පාරිභෝගිකයන් වඩාත් තෘප්තිමත් කිරීම සඳහා වාර්ෂිකව සැලසුම් සකස් කරනු ලැබේ.




## මාගේ කෘතඥතාවය

සංස්ථාව ස්ථායී ස්ථාවරයකට ගෙන ඒම සඳහා කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය අඛණ්ඩව දායකත්වය සැපයීම පිළිබඳව මාගේ අවංක ස්තූතිය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන භාවිතා කරන අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට මාගේ අවංක කෘතඥතාවය පළ කරමි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අමාත්‍යතුමාටත් අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, වනසංරක්ෂණ ජනරාල්තුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලු කාර්ය මණ්ඩලයටත් අනෙකුත් සියලු රජයේ නිලධාරීන්ටත්, අපහට ලබාදුන් සහයෝගය වෙනුවෙන් කෘතවේදීත්වය  පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

2018 වර්ෂය පහසු වර්ෂයක් නොවුවත් එම වර්ෂය තුළදී ලබාගත් අත්දැකීම් මුල්කරගෙන ඉදිරි වර්ෂ සඳහා සාර්ථකව මුහුණදීමේ අභිලාෂයෙන් කටයුතු කිරීම අපගේ අදිටනයි. අපගේ පාර්ශවකරුවන්ට හැකි උපරිම කැපවීමෙන් හොඳ ප්‍රතිලාභයක් ලබාදීමට අපි සැමවිටම ඇපකැප වී සිටිමු.



**ශාන්ත බණ්ඩාර**
**සභාපති**
රාජ්‍ය දැව සංස්ථාව



# සාමාන්‍යාධිකාරීතුමාගේ **සමාලෝචනය**

“රාජ්‍ය දැව සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. පෙර වසර සමඟ සැසඳීමේ දී මෙම වසර දැව කර්මාන්තයට ඉතා අභියෝගාත්මක වසරක් වුවත් ඉහළ පිරිවැය තත්වයක් යටතේ ලාභ උපයාගැනීමට හැකිවීම සුවිශේෂී කරුණක් ලෙස සඳහන් කළ හැක.

රාජ්‍ය දැව සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. පෙර වසර සමඟ සැසඳීමේ දී මෙම වසර දැව කර්මාන්තයට ඉතා අභියෝගාත්මක වසරක් වුවත් ඉහළ පිරිවැය තත්වයක් යටතේ ලාභ උපයාගැනීමට හැකිවීම සුවිශේෂී කරුණක් ලෙස සඳහන් කළ හැක. දශක 5ක කාලයක් පුරාවට ලබාගත් අත්දැකීම් සම්භාරයක් සමඟ රළු බොරළු මතින් ගලා ආ ගමන ගැන ආපසු හැරී බලද්දී සංස්ථාව පිළිබඳ ඉතා ගෞරවනීය හැඟීමක් මා හදවතට දැනේ.

අපි ගුණාත්මක දැව සහ දැව පදනම් කරගත් භාණ්ඩ නිෂ්පාදනය කර සාධාරණ මිලගණන් යටතේ පාරිභෝගිකයින්ට විකුණන්නෙමු. අපගේ නිත්‍ය පාරිභෝගිකයින් මෙන් ම නව ගනුදෙනුකරුවන් ද අපගේ සේවාව පිළිබඳව අතිශයින් සෑහීමකට පත්වන බව අප හොඳින් දන්නා කරුණකි. නවීන තාක්‍ෂණය උපයෝගී කරගනිමින් දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන ජාතියට ලබාදීමේ පුරෝගාමියෙකු ලෙස දැව නිෂ්පාදන කර්මාන්තය නංවාලීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව අඛණ්ඩව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. දිවයින පුරා විසිරීගිය ප්‍රාදේශීය කාර්යාල 12ක්, අලෙවි මධ්‍යස්ථාන 53ක්, වනවගා අස්වනු ලබාගැනීම සඳහා ක්‍රියාකාරී වැඩබිම් 200කට ආසන්න සංඛ්‍යාවක්, දැව පදම් කිරීමේ හා පරිරක්ෂණය කිරීමේ යන්ත්‍රාගාරවලින් සමන්විත ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 3ක් හා ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර 6ක් රාජ්‍ය දැව සංස්ථාව සතුවේ.

## ඉල්ලුම හා සැපයුම

ශ්‍රී ලංකාවේ වාර්ෂික ජාතික කාර්මික දැව ඉල්ලුම ඝන මීටර් ලක්‍ෂ 16-17ක් පමණ වේ. අප රටේ ජාතික ඉරුදැව අවශ්‍යතාවයෙන් 18%ක් පමණ එනම්, රු.මිලියන 9074ක වටිනාකමින් යුත් දැව ඝන මීටර් ලක්‍ෂ 1.5ක් පමණ ඉරූ දැව වාර්ෂිකව ආනයනය කිරීම සිදුවේ. වනසංරක්‍ෂණ දෙපාර්තමේන්තුව සතුව වනවගා හෙක්ටයාර් 100,000ක් පමණ තිබේ. මෙමගින් වසරකට හෙක්ටයාර් 2000ක් පමණ දැව ලබාගැනීමට නිදහස් කළ හැකි අතර, එමගින් වාර්ෂිකව දැව ඝන මීටර් ලක්‍ෂ 02කට වැඩි ප්‍රමාණයක් ජාතික දැව අවශ්‍යතාවය සඳහා ලබා දියහැක. එහෙත් දැනට නිදහස් කරනුයේ හෙක්ටයාර් 1000ක් වන අතර, එමගින් ලැබෙනුයේ දැව ඝන මීටර් 100,000ක් පමණි. දැව ආනයනය නවතාලීමට ඉතිරි හිඟ දැව ප්‍රමාණය ගෙවතු සංවර්ධනය තුළින්, වනවගා අස්වැන්න වැඩි කර ගැනීමෙන්, අසාර්ථක වනවගා සාර්ථක වනවගා බවට පරිවර්තනය කිරීමෙන් ඉටුකර ගත හැක. මේ අනුව ආනයනය කරන දැව ඝන මීටර් ලක්‍ෂ 1.5 දේශීයව සැපයීමෙන් අප රට දැව සම්පතින් ස්වයංපෝෂිත කළ හැක.

## වසරේ කාර්යසාධනය

පසුගිය අවුරුදු කිහිපයත් මෙම වර්ෂයත් සලකා බැලීමේදී රටේ පවතින ආර්ථික හා දේශපාලනමය වාතාවරණය සතුටුදායක නොවන තත්වයක් පවතින බැවින් ව්‍යාපාර කටයුතු සිදුකිරීමේ දී විශාල ගැටළු රැසකට මුහුණදීමට සිදුවිය. සංස්ථාවේ විකුණුම් ආදායමේ සැළකිය යුතු අඩුවීමත්, දැරීමට සිදුවූ අධික සේවක පිරිවැය සහ පරිපාලන වියදම් හේතුවෙන් පසුගිය වසරට සාපේක්‍ෂව මේ වසරේ කාර්යසාධනයේ පසුබෑමක් දක්නට ඇත. රාජ්‍ය දැව සංස්ථාව 2018 දී සිය අරමුණු හා ප්‍රතිපත්ති සකස් කර ඇත්තේ ජාතික ආර්ථික උපායමාර්ග හා සුදුසු ආර්ථික ප්‍රතිපත්තිවලට සමගාමීව තිරසාර ආර්ථික සංවර්ධනයක් ළඟා කරගැනීම අරමුණු කර ගනිමිනි. වාර්ෂික ශුද්ධ පිරිවැටුම 2018 දී රුපියල් මිලියන 4,069ක් වූ අතර එය පෙර වසරට සාපේක්‍ෂව 4%කින් අඩු වී ඇත. විවිධ වූ හැලහැප්පීම් මධ්‍යයේ වුවද ආදායම් බදු හා භාණ්ඩාගාර බදු පෙර ලාභය මෙම වසරේ දී රු.මිලියන 672ක් සහ පෙර වර්ෂයේ දී එය රුපියල් මිලියන 967 ලෙස වාර්තා විය. කෙසේවෙතත්, ජාතික ආර්ථිකයට රුපියල් මිලියන 2055 ක දායකත්වයක් ලබාදුන් අතර, එය භාණ්ඩාග ාරයට ගෙවූ විශේෂ බදු වශයෙන් රුපියල් මිලියන 100ක් ද, වක්‍ර සහ සෘජු බදු ලෙස රුපියල් මිලියන 744ක් ද, ස්කන්ධභාග ලෙස රුපියල් මිලියන 1355ක් ද, වශයෙනි. භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු හා ආදායම් බදු අඩුකළ පසු ලාභය රුපියල් මිලියන 322ක් වූ අතර, පෙර වර්ෂයේ එම අගය රුපියල් මිලියන 566 කි. පසුගිය වසර හා සැසඳීමේ දී මෙම වසර තුළ පසුබෑමක් දක්නට ලැබුන ද, මෙම වසර තුළ ලබාගත් කාර්ය සාධනයට වඩා ඉහළ කාර්යසාධනයක් ලබන වසර තුළදී අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් ක්‍රියාත්මක කොට ඇත. ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ජාතික ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන උළෙලේ දී රාජ්‍ය අංශයේ නිෂ්පාදන අංශය වෙනුවෙන් වසරේ විශිෂ්ටතම කාර්ය සාධනය

සඳහා වන රන් සම්මානය මෙවරත් දිනාගැනීමට හැකිවීම අපගේ කළමනාකාරිත්වයේත්, සේවකයන්ගේත් කැපවීම සාක්ෂි දරයි.

## වගකිව යුතු ආයතනයක් ලෙස ක්‍රියාකිරීම

ආර්ථිකය හා පරිසරය පිළිබඳ පවත්නා ආකල්ප සැළකිල්ලට ගනිමින් අපගේ මෙහෙයුම් කටයුතු සියල්ලම පාහේ 2018 වසර පුරාම පරිසර හිතකාමී ලෙස ක්‍රියාත්මක කිරීමට අපි උත්සහ දැරීමු. තවද, ගස් සිටුවීම සඳහා පාසැල් දරුවන්ගේ උනන්දුව තවදුරටත් ඉහළ නැංවීමේ අරමුණ ඇතිව "තුරුජන සිසු බැංකු" රුක්රෝපණ වැඩසටහන අඛණ්ඩව පවත්වා ගෙනයාමෙන් වගකිව යුතු ආයතනික පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමේ අවස්ථාව ලැබුණි. ඒ අනුව කෘෂිකාර්මික උපකරණ කට්ටල කෑගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල තෝරාගත් පාසැල් අතර බෙදාහරින ලද අතර, ගස් සිටුවීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ලෝක පරිසර දිනය නිමිත්තෙන් තෝරාගත් රාජ්‍ය ආයතන සඳහා පැළ බෙදාදීම සහ මාතර ඇළවේල්ල පාරේ කොස්ගස් සිටුවීමේ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. සමාජ වගකීමක් ලෙස සංස්ථාවේ විවිධ අංශ යටතේ පර්යේෂණ හා පුහුණුවීම් සඳහා උපාධි අපේක්ෂකයින්ට අවස්ථාව ලබාදෙන ලදී. ඊට අමතරව අපගේ 50වන සංවත්සරය සැමරුමට සමගාමීව විශේෂ ව්‍යාපෘතියක් ලෙස අප සංස්ථාවේ සේවකයන්ගේ විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන දරුවන්ට ශිෂ්‍යත්ව 43ක් පිරිනමන ලදී. අප විසින් පාරිභෝගික ඉල්ලුම මත පදනම් ව දැව හඳුනාගැනීමේ සහ සහතික කිරීමේ සේවාවක් ක්‍රියාත්මක කර ඇත. සංස්ථාවේ දැක්මට අනුකූලව වඩාත්ම විශ්වාසදායක හා හොඳම තත්ත්වයේ දැව සැපයුම්කරු ලෙස ජාතික වගකීම ඉටුකිරීමේ පුරෝගාමී මෙහෙවරේ ඉදිරියෙන් සිටී.

## සේව්‍යය සේවක සම්බන්ධතාවය

ආයතනයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැනනගින ගැටළු විසඳීම සඳහා ගනුලබන කාලෝචිත තීරණ සංස්ථාවේ සාර්ථකත්වය පිටුපස ඇති අනෙක් වැදගත් රහසයි. සංස්ථාවේ වටිනාම සම්පත මානව සම්පතයි. විවිධ අභියෝග මධ්‍යයේ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කරන ආකාරය ඉතා ප්‍රශංසනීයයි. ඔවුන්ගේ කැපවීම සහ උත්සාහය යහපත් කාලවල මෙන්ම දුෂ්කර කාලවලදී ද ආයතනයේ සාර්ථකත්වයට හේතු වී තිබේ. සේවක රැකියා සුරක්ෂිතතාවය සහතික කරමින් ආයතනයේ අභ්‍යන්තර පරිසරය සේවක විශ්වාසය ගොඩනැගෙන පරිදි විනිවිදභාවයෙන් යුතු සාධාරණ ක්‍රමවේදයකට අනුව සේවක උසස්වීම්, ස්ථාන මාරුවීම්, ශිෂ්‍යත්ව ලබාදීම් හා බඳවාගැනීම් සිදුකරනු ලබයි. සංස්ථාව විසින් සේවකයන් සඳහා විශාල පිරිවැයක් සෑම වසරකම දරමින් 2000කට ආසන්න සේවකයන්ගේ ජීවන තත්වය නඟාසිටුවීම සඳහා විවිධ පහසුකම් රැසක් ලබාදේ. ඒවාගේ ම විශාල සංඛ්‍යාවකට රැකියා අවස්ථා ලබාදීමෙන් රටේ ප්‍රධාන ගැටළුවක් වන රැකියා විරහිතභාවය අඩුකිරීම සඳහා රාජ්‍ය ආයතනයක් ලෙස වගකීමෙන් ක්‍රියාකරයි. සේවකයන්ගේ සේවා කාර්යක්ෂමතාවය මැනීමේ ක්‍රමවේදයක් ඉදිරියේදී හඳුන්වාදීමට කටයුතු සංවිධානය වෙමින් පවතින අතර, මෙමඟින් සේවකයන් දිරිමත් කිරීමත්, තෘප්තිමත් සේවක පිරිසක් බිහිකිරීමටත් බලාපොරොත්තු වෙමු.

## පරිසර සබැඳියාව

රාජ්‍ය දැව සංස්ථාව ඉල්ලුමට සරිලන දැව සැපයුම තිරසාර ලෙස සපයමින් පරිසරයට පාරිසරික වටිනාකමක් එකතු කරයි. හරිතාගාර වායුවක් වන කාබන්ඩයොක්සයිඩ් මගින් වායුගෝලීය තාපය රඳවා තබාගැනීම නිසා හරිතාගාර ආවරණය වැඩිවී එහි ප්‍රශස්ත මට්ටම අභිබවා යාමට තුඩු දී ඇත. ශාකවල ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය හරහා වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් 3.67 ගුණයක් අවශෝෂණය කිරීමෙන් ශාක පටක තුල කාබන් එක් අණුවක් ලෙස තැන්පත් කිරීමට හැකියාව ඇත. මෙය ශාක වර්ගය, වයස, වර්ධන වේගය, භූමි තත්වය සහ වනවගා කළමණාකරණය මත රඳා පවතී. දැව යනු පුනර්ජනනය කළ හැකි සම්පතකි. එබැවින් දැව හෙලීම සහ නිවැරදි දැව භාවිතය විද්‍යානුකූල සංකල්ප සලකා බලමින් සිදුකිරීමෙන් මහජනතාවගේ දැව පිපාසය සංසිඳුවීමට මෙන්ම ජනතාව තුල පාරිසරික ආකල්ප ඇති කිරීමට හැකිවේ. රාජ්‍ය දැව සංස්ථාවේ ඉදිරි 5 අවුරුදු සංයුක්ත කළමණාකරණ ක්‍රමවේද සැකසීමේදී එහි පාරිසරික සබැඳියාව සහ විද්‍යානුකූල දැක්ම තහවුරු කෙරෙන සංකල්ප මත සැකසීමට අපේක්ෂා කෙරේ.



## අනාගත දැක්ම

ඉදිරි වසර 10 තුළදී දැව කර්මාන්තය දියුණු කර, අගය එකතුකළ ගුණාත්මක තත්වයේ දැව භාණ්ඩ නිෂ්පාදනය කර දේශීය හා විදේශීය වෙළෙඳපොළට විකිණීමෙන් අලෙවි ආදායම වැඩි කරගැනීම සඳහා සැලසුම් සකස්කරමින් පවතී. රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහභාණ්ඩ ආදායම මුළු ආදායමෙන් 10%ක් වන ප්‍රමාණය ඉදිරි වසර 10 තුළදී 30% දක්වා ඉහළ නැංවීමට කටයුතු කිරීමත් දැව කඳන් ලෙස විකිණීමෙන් ලැබෙන ආදායම 69% සිට 50% දක්වා අඩුකිරීම මඟින් අගය එකතුකළ දැව නිෂ්පාදන වෙළෙඳපොළට නිකුත් කිරීමට බලාපොරොත්තු වේ. දැව සම්බන්ධ පර්යේෂණ පුළුල්ව ක්‍රියාත්මක කිරීමත්, ගෘහභාණ්ඩ නිෂ්පාදනයේ දී සියලු මෝස්තර Ergonomics සහ Anthropometric සිද්ධාන්ත සහ මිනිස් ශරීරයේ ව්‍යුහය සැළකිල්ලට ගෙන ඒ අනුව නිර්මාණකරණයේ යෙදීම මඟින් සිරුරට ඉතා සැපපහසු බවක් දැනීම මෙන්ම කායික අපහසුතා මගහරවා ගත හැක. දැව කඳන් වර්ගීකරණය කිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වාදීම තුළින් දැව කඳන් කළමනාකරණය විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව සිදුකිරීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී. ඉදිරි වර්ෂ තුළදී ISO සහතිකකරණය ලබාගැනීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම මඟින් ගෘහභාණ්ඩ නිෂ්පාදනයේ දී අමුද්‍රව්‍යය භාවිතයේ පටන් නිමි භාණ්ඩය බෙදාහැරීම දක්වාම ප්‍රමිතිය සහතික කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමු.

## මගේ හදපිරි කෘතඥතාවය

සංස්ථාවේ ශක්‍යතාව සහතික කිරීම සඳහා කැපවීමෙන් සහයෝගය දැක්වීම පිළිබඳව මාගේ සහෝදර සේවකයින්ට, සභාපතිවරයාට සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. තවද, අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට මාගේ අවංක කෘතඥතාවය පළ කරන අතර, දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන සපයන ප්‍රමුඛතම සැපයුම්කරු ඔබගේ අවශ්‍යතාවය අනුව අද්විතීය නිෂ්පාදන ලබාදීමෙන් ඔබට සේවය කිරීමට අපි සැමවිටම සූදානම්ව සිටිමු. අවසාන වශයෙන් ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා සහ අමාත්‍යංශයේ ලේකම්, වන සංරක්ෂණ ජනරාල් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 2018 වර්ෂය තුළ අපගේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දක්වන ලද අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් කෘතවේදීත්වය මින් පලකරමි.

රාජ්‍ය දැව සංස්ථාව යනු හුදෙක් ජාතියට බොරු මවාපෑම් කර ලාභ උපයන ආයතනයක් නොවේ. අපේ ව්‍යාපාරය හුදෙක් මුළු රටේම සහ පරිසරයේ අනාගතය සහතික කරන අයුරින් සිදුකිරීමට හැමවිටම කැපවෙමු. රාජ්‍ය දැව සංස්ථාව විසින් සහතික කරන ලද ඔබේ වටිනා හරිත දැව නිෂ්පාදනය තවත් පරම්පරා ගණනාවක් සඳහා සුරැකෙනු ඇතැයි අපේ පැතුමයි.



**ආචාර්ය එන්.ඩී. රුවන්පතිරණ**
**සාමාන්‍යාධිකාරී**
රාජ්‍ය දැව සංස්ථාව



## අපගේ කාර්යභාරයන්

- වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.
- දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.
- දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.
- දැව ආනයනය කිරීම.
- නව වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වනවගා කිරීම, කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.
- කෘෂිකාර්මික නිෂ්පාදන.
- දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.
- පෞද්ගලික ඉඩම් වලින් දැව මිලදීගැනීම.
- වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.
- වේවැල් ආනයනය කිරීම.
- නියැඳි පරීක්ෂා කිරීම් මගින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනා ගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.
- දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැලසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

## අපගේ ව්‍යාපාරික වටිනාකම්

- ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.
- පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමණාකරණයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටු කිරීමට අපි කැපවෙමු.
- ගනුදෙනුකරුවන් සමඟ ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගනිමින්, ඔවුනට සහ සියළුම ශ්‍රී ලාංකිකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලික ම කාරණය ලෙස අපි පිළිගන්නෙමු.
- කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.
- ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියළු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.
- සියළුම මෙහෙයුම් කටයුතු වලදී සහ සේවා සැපයීමේදී පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබා ගන්නා බවට සහතික වන්නෙමු.
- අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.

# අධ්‍යක්ෂක මණ්ඩලය - 2018

**කේ.ඩබ්ලිව්. ශාන්ත බණ්ඩාර**
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

**එච්.වයි.ටී. පවරකුමාර**
ක්‍රියාකාරී අධ්‍යක්ෂක
රාජ්‍ය දැව සංස්ථාව

**ඩී. විජේසිරිවර්ධන මහතා**
අධ්‍යක්ෂක
භාණ්ඩාගාර නියෝජිත

**එස්.ඒ.ඒ. සතුරුසිංහ**
අධ්‍යක්ෂක
වන සංරක්ෂණ ජනරාල්

**එම්.වී. කරුණාරත්න**
අධ්‍යක්ෂක

**ටී.පී. රන්ජන් ප්‍රනාන්දු**
අධ්‍යක්ෂක

**ඒ.එම්.සී. පෙරේරා**
අධ්‍යක්ෂක



# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල - 2018

**ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.ජේ කුරේ මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණනය

**ජී.ඩී.එස්. කුමාරසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**එම්.ඒ.සී.එන්.සමරසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන

**එම්.සී.දේවේන්ද්‍ර මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්

**ඩබ්ලිව්.බී.සමන්ත මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩ ආවරණ) - අලෙවි

**ජී.ජී. තිසර ගමගේ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩ ආවරණ) - ඉංජිනේරු සහ නිෂ්පාදන

# 2018 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නේ හද පිරි සතුටිනි.

## හැඳින්වීම

රාජ්‍ය දැව සංස්ථාව යනු 1968 දී 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද රාජ්‍ය ආයතනයකි. රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය "සම්පත්පාය" බත්තරමුල්ලෙහි පිහිටා ඇති අතර, ප්‍රාදේශීය කාර්යාල දිවයින පුරා විසිරී පවතී.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය දැව සංස්ථාව මූලික වශයෙන් දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන අලෙවිය තුළින් තම ආදායම් උපයාගනී.

## ව්‍යාපාර සමාලෝචනය


2018 වර්ෂය වේගයෙන් වෙනස් වන ආර්ථික, දේශපාලන හා පාරිසරික තත්වයන් යටතේ ශ්‍රී ලංකාවට අභියෝගාත්මක වසරක් ලෙස හැඳින්විය හැක. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ උපායමාර්ග තීරණ සමඟින්, සංස්ථාව සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සාධාරණ ලෙස තම ව්‍යාපාර කටයුතු කළ අතර, පසුගිය වසරවල දී මෙන් ම වාර්ෂික අයවැය ට අනුව මෙහෙයුම් කටයුතු සිදුකිරීමට වගබලා ගන්නා ලදී. සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් ක්‍රියාවට නංවන ලද උපයාමාර්ග හේතුවෙන් යහපත් ආදායම් සහ ලාභදායිතා දර්ශක මඟින් ව්‍යාපාරයේ පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය තහවුරු විය. අප සංස්ථාව මුහුණදෙන ප්‍රධාන අභියෝග අතර ස්වාභාවික දැව සම්පත ලබාගැනීමේ දී පැනනඟින ගැටළු, දිනෙන් දින වර්ධනය වන වෙළෙඳපොළ තරඟකාරිත්වය සහ වෙළෙඳපොළේ ස්වභාවික සම්පත් සඳහා පවතින ආදේශකවලට දැන් දැන් ජනතාව නැඹුරුවීම දැක්විය හැක.


රජය විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ශ්‍රී ලංකාවට ගුණාත්මක දැව ආනයනය කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව සිය ව්‍යාපාරික කටයුතු පුළුල් කර තිබේ. කෙසේ වෙතත්, අවාසනාවකට අනෙක් දේශීය ආනයනකරුවන්ගේ මිල හා සසඳන විට සංස්ථාව විසින් ආනයනය කරනු ලබන දැව මිලගණන් තරමක් ඉහළ මට්ටමක පවතී. රජයේ ආයතනයක් ලෙස අපට කිසිවිටෙකත් ගුණාත්මක බවින් අඩු තත්වයකින් යුත් නිෂ්පාදන ආනයනය කළ නොහැක. එහි ප්‍රතිපලයක් ලෙස, තවමත් හොඳ ව්‍යාපාරික ආචාර ධර්ම ආරක්‍ෂා කරමින් වගකිව යුතු ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව සිය කීර්තිනාමය පවත්වා ගෙන යයි.

## මූල්‍ය කාර්යසාධනය


| කාර්යසාධනය | 2018 | 2017 |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| පිරිවැටුම | 4,069 | 4,254 |
| දළ ලාභය | 1,965 | 2,076 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 73 | 103 |
| මෙහෙයුම් ලාභය | 358 | 693 |
| මෙහෙයුම් නොවන ආදායම් | 315 | 274 |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | 100 | 100 |
| භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ලාභය | 672 | 967 |


වර්ෂය තුළ සංස්ථාවේ පිරිවැටුම රු.මිලියන 4,069 ක් වූ අතර, එය පෙර වර්ෂයේ රු.මිලියන 4,254 කි. සමාලෝචනයට භාජනය වන වර්ෂයේ මුළු පිරිවැටුම පෙර වසරට සාපේක්‍ෂව 4% කින් අඩුවීමක් දක්නට ඇත. 2018 වර්ෂය තුළ දළ ලාභය රු.මිලියන 1,965 ක් වූ අතර එය පෙර වසරේ මිලියන 2,076 හා සසඳන විට පෙර වසරට සාපේක්‍ෂව 5% කින් අඩු වී තිබේ.





සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා බදු සහ බද්දට පෙර ශුද්ධ ලාභය රු.මිලියන 672 ක් වූ අතර, පසුගිය වසරේ දී භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 967 ක් විය. එනම් මෙම වසරේ දී භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය පසුගිය වසරට සාපේක්‍ෂව රු.මිලියන 295 ක අඩුවීමකි. ඉහළ ලාභයක් උපයාගැනීමට පමණක් නොසිතා වගකිව යුතු ආයතනයක් ලෙස ක්‍රියාකිරීමට සංස්ථාව සැමවිටම පෙරමුණ ගෙන සිටී. ශ්‍රී ලංකාවේ ඉහළ විරැකියා අනුපාතය අඩුකිරීම සඳහා රැකියා අවස්ථා ලබාදෙමින් රජයට සහයවීමත්, වෙළෙඳපොළට ගුණාත්මක නිෂ්පාදන සැපයීමත් සිදුකරනු ලබයි. එබැවින් සංස්ථාවට ඉහළ මෙහෙයුම් පිරිවැයක් දැරීමට සිදුවන අතර, සෑම වසරකම ඉහළ සේවක පිරිවැයක් ද දැරීමට සිදුවේ. රුපියල් මිලියන 2,104 ක් වූ විකුණුම් පිරිවැයට අමතරව සමාලෝචනය කරන වර්ෂය සඳහා සංස්ථාව විසින් පරිපාලන, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් වශයෙන් රු.මිලියන 1,680 ක් වියදම් දරා ඇති අතර, ඉන් සේවක පිරිවැය ලෙස රු.මිලියන 1,602 ක් වර්ෂය තුළ දරන ලදී.




මෙහෙයුම් කටයුතු සඳහා වන සියලු වියදම් සහ භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු සහ ආදායම් බදු අඩුකළ පසු 2018 දී සංස්ථාවේ ශුද්ධ ලාභය රු.මිලියන 322 කි. මෙම වසරේ කාර්යසාධනය ඇගයීමෙන් අනතුරුව, වර්ධනය වන ගෝලීය හා දේශීය වෙළෙඳපොළ තරඟ යටතේ හොඳින් කටයුතු කිරීම සඳහා අපගේ සියලු ශක්තීන් යොදා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් විවිධාංගීකරණය කිරීම සඳහා සැලසුම් සකස්කරමින් පවතී. සංස්ථාව විසින් නිෂ්පාදනය කොට දේශීය වෙළඳපොළට නිකුත් කරන අගය එකතුකළ නිෂ්පාදන සඳහා විශාල ඉල්ලුමක් නිර්මාණය වී ඇත.

වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය මඟින් සංස්ථාවට එහි වත්කම් උපයෝගී කර ගනිමින් ලාභ උපයාගත හැකි වූයේ කෙසේ ද යන්න පිළිබිඹු වන අතර, ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය යනු ප්‍රාග්ධනවලට සාපේක්‍ෂව ව්‍යාපාරයක ලාභදායීතාවය මැනීමකි. 2017 සහ 2018 සඳහා වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම මත ප්‍රතිලාභ පහත පරිදි වේ.

| | වත්කම් මත ප්‍රතිලාභ | හිමිකම මත ප්‍රතිලාභ |
|---|---|---|
| 2017 | 3.8% | 5.7% |
| 2018 | 6.6% | 9.2% |

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 6.6% ක් සහ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය 9.2% ක් ලබාගැනීමට හැකි වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 72% සහ 61% ක වර්ධනයකි. සමාලෝචිත වර්ෂය සඳහා රජයේ ආදායමට සංස්ථාවේ දායකත්වය රු.මිලියන 2,199 ක් ලබාදුන් අතර, ඉන් රු.මිලියන 100 ක් විශේෂ බදු ලෙස භාණ්ඩාගාරයට ලබාදෙන ලදී.

අපගේ උපායමාර්ග ලෙස නව්‍ය නිෂ්පාදන කළඹ සංවර්ධනය කිරීම, නාස්තිය අවම කිරීම, දැව සඳහා ආදේශක හඳුන්වාදීම, වටිනා දැව ගස් සිටුවීමට ජනතාව දිරිමත් කිරීම සහ විදේශ මුදල් උපයාගැනීම සඳහා වෙනත් රටවලින් ඇණවුම් ලබාගැනීම සඳහා විශේෂ ගිවිසුම් අත්සන් කිරීම කෙරෙහි වඩාත් අවධානය යොමුකරනු ඇත. කෙටි කාලීන හා මධ්‍ය කාලීනව සංස්ථාවේ සංවර්ධනය ශක්තිමත්ව පවත්වා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

## නිෂ්පාදනය

මෙහෙයුම් ක්‍රියාවලිය පරිසර හිතකාමී වීම ගුණාත්මක ඉහළ නිෂ්පාදන මට්ටමක් පවත්වාගැනීම සඳහා මෙන් ම ආයතනයේ පැවැත්මට සහ ලාභදායිතාවයට මෙන් ම ආයතනික අභ්‍යන්තර හා බාහිර සංරචකවල යහපැවැත්මට අත්‍යවශ්‍ය බව සංස්ථාව තරයේ විශ්වාස කරයි. අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාව නොවළක්වාලමින් වර්තමාන අවශ්‍යතා සපුරාලීම සඳහා ස්වභාවික සම්පත් පවතින සීමිත සම්පත් උපරිම අයුරින් උපයෝගී කරගැනීම සහතික කරමින් ආයතනික උපායමාර්ග සමඟ පාරිසරික තුළිතභාවය ඒකාබද්ධ කිරීමේ හැකියාව සංස්ථාව නිරන්තරයෙන් වැඩි දියුණු කරයි.

තිරසර සංවර්ධනයට සානුබල සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් මෙහෙයුම් අංශයේ ව්‍යුහයන්, පද්ධතීන්, ශ්‍රම බලකාය සහ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය නව තාක්ෂණය නිතරම යොදාගනු ලැබේ. රජය විසින් පනවනු ලබන නීති හා රෙගුලාසි වලට එකඟතාවය දක්වමින් ඒවාට අනුකූලව කටයුතු කිරීම, ක්‍රමවත් වැඩබිම් වර්ගීකරණ ලැයිස්තුවක් සකස් කිරීම, විද්‍යාත්මක දැව නිස්සාරණය, නිවැරදි දැව පරිරක්ෂණ ක්‍රම භාවිතය, විධිමත් අයුරින් යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම, සේවකයින් බඳවාගැනීමේ සහ සංවර්ධනය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් ඇති කිරීම, සංස්ථාවේ කෙටි හා දිගුකාලීන අරමුණු තිරසාර ආකාරයකින් ඉටුකර ගැනීමට ඉවහල් විය. සැබවින් ම රාජ්‍ය දැව සංස්ථාව යනු ශ්‍රී ලංකාවේ තිරසාර වන කළමනාකරණය සඳහා දායකත්වය සපයන ප්‍රධාන ආයතනයයි. විද්‍යාත්මක දැව නිස්සාරණයේ දී ශාකයේ භෞතික හා ජීව විද්‍යාත්මක ස්වභාවය, වනාන්තර යටි වගාව, ස්වභාවික වනාන්තර ප්‍රදේශයේ ජීව විද්‍යාත්මක අන්තර් සම්බන්ධතා, සුළඟේ දිසාව, භූමියේ බෑවුම, පසෙහි ස්වභාවය සහ ජල මූලාශ්‍රවල පිහිටීම යනාදි කරුණු රාශියක් ඇගයීමට ලක් කරයි. එය පරිසර හානිය අඩු කරමින් කාබන් විමෝචනය පහළ දැමීමට දායකවේ. ගෘහභාණ්ඩ නිෂ්පාදනයේ දී ඉවත් කරනු ලබන කුඩා දැව කැබලි එකතුකොට (Finger Joint) පුවරු නිෂ්පාදනය කරයි. මෙම පුවරු නැවත ගෘහභාණ්ඩ නිෂ්පාදනයට ද යොදාගනී.

සංස්ථාව විවිධ කාලයන්හි දී එහි පැවැත්මට සුළු පරිමාණයේ සිට දැවැන්ත මට්ටමේ බලපෑම් සිදුවන විවිධ අර්බුදකාරී අවස්ථාවන්ට මුහුණ දෙන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මේරූ වන වගා භූමි ප්‍රමාණය පැහැදිලි ලෙස අඩුවීම, මුහුදු මට්ටමේ සිට අඩි 5000 ක උසින් සිදුකරනු ලැබූ දැව හෙලීම් තහනම් කිරීම, රාජ්‍ය වැවිලි සමාගම් ඔවුන්ගේ දැව විවෘත වෙළෙඳපොලේ අලෙවි කිරීමට තීරණය කිරීම, දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා විවිධ ආදේශක නිෂ්පාදන වෙළෙඳපොළ තුල බහුලවීම මෙවැනි තර්ජන වලට උදාහරණ ලෙස දැක්විය හැකිය.

ආරක්ෂාකාරී වෙළෙඳපොල උපායමාර්ග යොදාගනිමින් වෙළෙඳපොල සංවර්ධනය කිරීම, ප්‍රවර්ධන කටයුතු ඉහළ නැංවීම, නිෂ්පාදනයේ වටිනාකම ඉහළ දැමීම, නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීම සහ නිෂ්පාදන ක්‍රියාවලියේ දී දැව උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම ආදී ක්‍රියාකාරකම් මගින් මුහුණදීමට සිදු වූ තර්ජනවල බලපෑම අවම මට්ටමකට ගෙන ඒමට අපට හැකි විය. එසේම පහත ක්‍රමෝපායන් යොදාගැනීම මඟින් වෙළෙඳපොළ තරඟකාරිත්ව වාසි ළඟාකර ගතහැකි බව අවබෝධ කරගෙන ඇත. ඒවා නම් රාජ්‍ය වැවිලි සංස්ථාවෙන්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන්, ඇල්කඩුව වැවිලි සමාගමෙන් වාණිජ වටිනාකමකින් යුත් දැව මිලදීගනිමින් සිල්පර සහ විදුලිකණු නිෂ්පාදනය කිරීම, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමියන්හි විද්‍යාත්මක දැව නිස්සාරණය කිරීම සඳහා කටයුතු කිරීම, පරිරක්ෂිත සිල්පර ප්‍රතිඅපනයනය කිරීමේ ව්‍යාපෘතිය ඔස්සේ වෙළෙඳපොළ සංවර්ධනය කිරීම, ඉද්දපොල පදවලයාය තේක්ක දැව ඉවත් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරමින් ඝ.මී.64,000 කට ආසන්න දැව ඝනත්වයක් ලබාගැනීමට කටයුතු කිරීම සහ විද්‍යාත්මක දැව නිස්සාරණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම තුලින් උපරිම දැව අස්වැන්නක් ලබාගැනීමට කටයුතු කිරීම යන උපායමාර්ගයි.

### රජයේ කැළෑවලින් දැව හෙලීම්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මුදාහරින ලද පරිණත වනවගාවන් හි ප්‍රමාණය අඩුවීම මෑතකදී අපට මුහුණදීමට සිදු වූ ප්‍රධාන බාධකයකි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව නිදහස් කරන වනවගා ප්‍රමාණය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අමතර ප්‍රමාණයක් නිදහස් කරගැනීමත්, රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් සිල්පර සහ විදුලි සම්ප්‍රේෂණ කණු සඳහා අවශ්‍ය දැව ලබාගැනීමත්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාවට අයත් ඉඩම්වලින් දැව ලබාගැනීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙලීම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වන වගා නිදහස් කරනු ලබන අතර 2017 හා 2018 වර්ෂ වල හෙලීම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය පහත පරිදි වේ.

| දැව විශේෂය | පූර්ණ හෙලීම් (හෙක්ටයාර්) | | තුනීකිරීම් (හෙක්ටයාර්) | |
|---|---|---|---|---|
| | 2018 | 2017 | 2018 | 2017 |
| තේක්ක | 836.4 | 569.8 | 225 | 375.9 |
| යුකැලිප්ටස් | 73 | 210.7 | 526 | 515.0 |
| පයිනස් | 124.3 | 160.2 | - | - |
| කාය | - | - | 37 | 20.0 |
| ඇකේෂියා | 65.1 | 30.0 | - | - |

### ඉරූ දැව බවට පරිවර්තනය කිරීම

2017 වර්ෂයේ ඉරුදැව නිෂ්පාදනය ඝන මීටර් 4,909 ට සාපේක්ෂව 2018 වර්ෂය තුළදී ඉරුදැව ඝන මීටර් 4,389 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඝන මීටර් 3,059 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ශබඩා මගින් අලෙවි කර ඇත.

### විදුලි කණු සහ සිල්පර පරිරක්ෂණය කිරීම

2018 වර්ෂය තුලදී සිල්පර 43,651 ක්, විදුලිකණු 9,850 ක් හා අලිවැටකණු 17,155 ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බූස්ස පරිරක්ෂණාගාර වලින් පරිරක්ෂණය කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව 2018 වසරේ විදුලිකණු ඉල්ලුමේ අඩුවීම හේතුවෙන් නිෂ්පාදනයේ සැලකිය යුතු පසුබෑමක් දක්නට ඇත.

### ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් රුපියල් මිලියන 232.2 ක් වටිනා ගෘහභාණ්ඩ සලකා බලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත. ඒ අතර රුපියල් මිලියන 301.9 (බදු රහිත) ක් වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, නුවර, රත්නපුර, තලල්ල, බූස්ස, අම්පාර හා නුගේගොඩ ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත. පෙර වසරට සාපේක්ෂව මෙම වර්ෂය තුළ ගෘහභාණ්ඩ අලෙවිය 21% කින් පහත වැටී ඇත.

### 2017 - 2018 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම

| | නිෂ්පාදනය | | විකුණුම් පරිමාව | | විකුණුම් වටිනාකම (බදු ඇතුළුව) | |
|---|---|---|---|---|---|---|
| | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 |
| | | | | | රු.මිලියන | රු.මිලියන |
| කඳන් ඝ.මී | 130,040 | 146,094 | 115,471 | 131,518 | 3,249.2 | 3,653.7 |
| ඉරුදැව ඝ.මී | 4,389 | 4,909 | 3,059 | 2,997 | 268.5 | 290.2 |
| සිල්පර ඒකක | 43,651 | 7,416 | 45,301 | 14,322 | 499.2 | 153.1 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| විදුලි කණු ඒකක | 9,850 | 20,186 | 11,733 | 19,484 | 120.1 | 197.8 |
| අලිවැට කණු ඒකක | 17,155 | 33,424 | 34,493 | 25,616 | 131.5 | 88.9 |
| වට කණු ඒකක | 112,837 | 141,790 | 114,058 | 132,863 | 20.4 | 21.3 |
| දර ඝ.මී | 101,172 | 126,861 | 95,680 | 119,669 | 57.7 | 64.5 |
| වැට කණු ඒකක | 125,967 | 114,681 | 89,917 | 103,516 | 11.7 | 13.9 |


## පාරිභෝගික අභිමතයන් කළමනාකරණය

රාජ්‍ය දැව සංස්ථාවේ අලෙවි අංශය මගින්, සංස්ථාවේ ව්‍යාපාර හා මෙහෙවර ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. අපගේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සාමූහික ලෙස පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් අප අංශය මගින් සිදුවේ.

- පාරිභෝගික මිලදීගැනීමේ රටාවන් පර්යේෂණය හා වෙළඳපොළ අලෙවි රටාවන් නිරික්ෂණය කිරීම මගින් අලෙවිය සඳහා ඉදිරිපත් කළ යුතු නිෂ්පාදනයන් තීරණය කිරීම.
- වෙළඳපොළ තරඟකාරිත්වයට මුහුණදීමට නවීන ගෘහභාණ්ඩ නිෂ්පාදනයන් සිදුකිරීම.
- අනාගත පාරිභෝගිකයන් රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදන පිළිබඳව දැනුවත් කිරීම හා භාණ්ඩ මිලදීගැනීමට ඔවුන්ව පොළඹවා ගැනීම සඳහා ඔවුන් වෙත ළඟා වියහැකි ආකාරය තීරණය කිරීම.
- රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදනයන් පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කිරීම් සඳහා අලෙවිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

දැව හා දැව ආශ්‍රිත කර්මාන්තයේ නියුතු කුඩා පරිමාණ ව්‍යවසායකයින් අප විසින් අවශ්‍යතා සපුරාලන නව වෙළඳපොළ කොටස තුළට පැමිණීමට උපායමාර්ග ක්‍රියාත්මක කිරීම, 2018 වර්ෂයේ දී අප විසින් හඳුනාගෙන ඇති ප්‍රධානතම අවදානම ලෙස හැඳින්විය හැක. වර්තමාන ප්‍රවණතාවයන්ට ගැළපෙන පරිදි ගනුදෙනුකරුවන් ඉලක්ක කර ගැනීම සඳහා ඔවුන් උපායමාර්ග සංවර්ධනය කරමින් සිටී. මේ අනුව අවදානම කළමනාකරණය කිරීමේ උපායමාර්ගයක් ලෙස හා ප්‍රධාන වෙළඳපොළ තරඟකරුවන් සමඟ තරඟ කිරීම සඳහා අපගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, විශේෂිත වශයෙන් අපගේ නිෂ්පාදනයන් සිදුකිරීම සඳහා භාවිතා කරන දැවවල ගුණාත්මකභාවය ඉස්මතුවන අලෙවිකරණ උපායමාර්ග සකස් කිරීම 2018 වර්ෂයේ දී සිදුකරන ලදී. තවද, අප සතුව පවතින විවිධාංගීකරණය වූ නිෂ්පාදන පරාසය මඟින් ද අවදානම මඟහරවා ගැනීමට අපේක්ෂා කරන ලදී.

### සමස්ථ ආදායමට එක් එක් නිෂ්පාදිතය මගින් වන දායකත්වය




විවිධාංගීකරණය වූ නිෂ්පාදන පෙළක් සපයන අතරම, සුදුසුකම් ලත් නිර්මාණ කණ්ඩායමක් මගින් පාරිභෝගික ඉල්ලීම අනුව නිෂ්පාදනයන් කිරීම (customized) කිරීම මගින් ද වෙළඳපොළ තරඟකාරිත්වය තුළ ඉහළින් සිටීමට අප හට හැකියාව ලැබී ඇත. ප්‍රශස්ත මට්ටමට නොපැමිණෙන නොදියුණු කර්මාන්තවල ක්‍රියාත්මක වීමට සිදුවීම අප මුහුණ දෙන එක් විශාල අභියෝගයක් වන අතර, මෙම නිසා දැව රටතුළ පමණක් භාවිතා කිරීමට සිදුවන අතර, එමගින් ඌණ උපයෝජනයක් සිදුවේ. වනවගාවන්ගෙන් සහ අනෙකුත් මූලාශ්‍ර මගින් ලබාගත් දැව අස්වැන්න වර්තමාන කර්මාන්ත ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රශස්ත ගුණාත්මකභාවයකින් තොර බැවින්, එම දැව ක්ෂයවීමට පෙර විකිණීම සඳහා වටිනාකම පහත හෙලීම අවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් අවස්ථාවල නිෂ්පාදන පිරිවැය පියවා ගැනීමට ද නොහැකි වී තිබේ. නැගීඑන කුඩා පරිමාණ දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන ආයතන මෙන් ම මහා පරිමාණ නිෂ්පාදකයන්ගෙන් සමන්විත ශ්‍රී ලාංකික දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ ඉතා තරඟකාරී වුව ද, 2018 වර්ෂයේ දී රාජ්‍ය දැව සංස්ථාව එක් එක් නිෂ්පාදනයන් සඳහා හිමි කරගෙන ඇති වෙළඳපොළ කොටස පහත පරිදි වේ.

- 13% - කඳන්, ඉරුදැව හා ගෘහභාණ්ඩ හැර අනෙකුත් දැවමය නිෂ්පාදන සඳහා
- 0.5% - ගෘහ භාණ්ඩ සඳහා
- 12.29% - දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය තුළ රාජ්‍ය දැව සංස්ථාව සතු මුළු වෙළඳපොළ කොටස.

සම්ප්‍රේෂණ කණු, අලිවැට කණු සහ සිල්පර සැපයීම රාජ්‍ය දැව සංස්ථාව සතු වන බැවින්, එම නිෂ්පාදන මිලදීගනු ලබන අදාළ ආයතනයන් හි ඉල්ලුමට අනුව එම නිෂ්පාදන නියමිත වේලාවට සැපයීමට අපි බැඳී සිටිමු. ඇතැම් දැව විශේෂයන් හි කඳන් හා ඉරුදැව ව්‍යවසායකයින්ට පමණක් අලෙවි කිරීම මගින් ඔවුන්ට අවශ්‍ය සහාය හා මගපෙන්වීම ලබාදීම අප විසින් සිදකරනු ලබන අතර, එමගින් සමාජ මෙහෙවරක් ද සිදුවේ. දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ තුළ රාජ්‍ය දැව සංස්ථාවට සැළකිය යුතු ප්‍රමාණයේ වෙළඳපොළ කොටසක් හිමිවන බැවින් කඳන් හා ඉරුදැව නිෂ්පාදනයන් හි මිල පාලනය කිරීමට අප හට හැකියාව ඇති අතර, මිල තීරණය කරගන්නා ලෙස ද කටයුතු කරනු ලබයි. “ගනුදෙනුකරුවන් ඕනෑම ව්‍යාපාරයක් සඳහා මූලික වේ.” සියලුම ආයතන තම පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා නිෂ්පාදනයන් සිදුකරන අතර, විකුණුම් හරහා වෙළඳපොළ කොටස වැඩිකිරීමට කටයුතු කරයි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව කාර්යක්ෂම හා ඵලදායී අලෙවිකරණ සැලැස්මක් ක්‍රියාත්මක කරන ලදී. සාර්ථක අලෙවිකරණ සැලැස්මක් පාරිභෝගික අපේක්ෂාවන් හා අවශ්‍යතා මත පදනම් වේ. එබැවින් රාජ්‍ය දැව සංස්ථාවේ අලෙවිකරණ සැලැස්ම හරහා අලෙවිකරණ මූලිකාංග වන 4P’s (නිෂ්පාදන, මිල, ස්ථානය, ප්‍රවර්ධනය) හි සෑම අංශයක් ම තහවුරු කරන ලදී. එනම්,

- බෙදාහැරීමේ නව නාලිකා
- පාරිභෝගිකයා අරමුණු කරගත් නිෂ්පාදන සැලැස්ම
- මිලකරණ ආකෘතියේ සුළු වෙනසක්
- නව ප්‍රවර්ධන උපායමාර්ග

වර්තමානයේ පාරිභෝගිකයන් බොහොමයක් භාණ්ඩ මිලදීගැනීමට, මිලගණන් සැසඳීමට හා භාණ්ඩ ඇණවුම් කිරීමට අන්තර්ජාලය යොදාගන්නා බැවින්, එම පාරිභෝගික කණ්ඩායමේ අවශ්‍යතා ඉටුකිරීම සඳහා 2018 වර්ෂයේ දී අපගේ වෙබ් අඩවිය හරහා භාණ්ඩ මිලදීගැනීමේ පහසුකම අපගේ පාරිභෝගිකයන්ට ලබාදීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.


### ඉලක්ක හා සපුරාගැනීම් පිළිබඳ සමාලෝචනය සහ අධීක්ෂණය

සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් හා සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් මාසිකව කළමනාකරණ රැස්වීම් පවත්වනු ලබන අතර, එහිදී සත්‍ය කාර්යසාධනය, නිෂ්පාදනය සහ අලෙවි ඉලක්ක සමග සසඳා බලනු ලැබේ. මෙම රැස්වීම්වලදී සියලුම බාධක හා ගැටළු අදාල ප්‍රාදේශීය කළමනාකරුවන් සමග සාකච්ඡා කර හඳුනාගනු ලබන අතර, ඒ සම්බන්ධ විවිධ තීරණ හා විකල්ප ක්‍රියාමාර්ග යෝජනා කර පසුව එම යෝජනා ඇගයීමට ලක්කර ක්‍රියාත්මක කරනු ලැබේ. තවද සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂයෙන් හා අපේක්ෂිත මුදල් ප්‍රවාහය ළඟාකරගෙන මූල්‍යමය අතින් ශක්තිමත් ආයතනයක් බවට තහවුරු කිරීමේ අරමුණින් නව අවස්ථාවන්, නව අදහස් හා කළයුතු වෙනස්කම් සම්බන්ධයෙන් ද සාකච්ඡා කරනු ලැබේ.


අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

**ශාන්ත බණ්ඩාර**
**සභාපති**
රාජ්‍ය දැව සංස්ථාව


# අපගේ ආවරණ කලාප





## අම්පාර ප්‍රාදේශිකය




## අනුරාධපුර ප්‍රාදේශීකය




## බණ්ඩාරවෙල ප්‍රාදේශිකය



## කොළඹ ප්‍රාදේශිකය




මීරිගම අලෙවි ගබඩාව
කඩවත අලෙවි ගබඩාව

පන්නිපිටිය අලෙවි ගබඩාව

කල්දෙමුල්ල අලෙවි ගබඩාව
කොළඹ ප්‍රාදේශීය කාර්යාලය
රත්මලාන අලෙවි ගබඩාව
කල්දෙමුල්ල ලී මෝල
රත්මලාන ප්‍රදර්ශනාගාරය

එගොඩ උයන අලෙවි ගබඩාව
මොරටුමුල්ල අලෙවි ගබඩාව
විල්ලෝරවත්ත අලෙවි ගබඩාව



## යාපනය ප්‍රාදේශිකය



යාපනය ප්‍රාදේශීය කාර්යාලය
යාපනය අලෙවි ගබඩාව

නල්ලූර් අලෙවි ගබඩාව
කිලිනොච්චි අලෙවි ගබඩාව



## මහනුවර ප්‍රාදේශිකය



දඹුලුඔය අලෙවි ගබඩාව

මාතලේ අලෙවි ගබඩාව

පල්ලෙකැලේ අලෙවි ගබඩාව
මහනුවර ප්‍රාදේශීය කාර්යාලය
මහනුවර ප්‍රදර්ශනාගාරය
නෙලුන්දෙනිය අලෙවි ගබඩාව

ඇත්ගාල අලෙවි ගබඩාව
ඇත්ගාල ලී මෝල





## කුරුණෑගල ප්‍රාදේශිකය



පුත්තලම අලෙවි ගබඩාව

නිකවැරටිය අලෙවි ගබඩාව

මැල්සිරිපුර අලෙවි ගබඩාව
මැල්සිරිපුර ලී මෝල

බිංගිරිය අලෙවි ගබඩාව

කංකානියාමුල්ල අලෙවි ගබඩාව
නයිනමඩම අලෙවි ගබඩාව

කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය
කුරුණෑගල අලෙවි ගබඩාව



## මොණරාගල ප්‍රාදේශිකය




මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය

බුත්තල අලෙවි ගබඩාව

වැල්ලවාය අලෙවි ගබඩාව




## මාතර ප්‍රාදේශිකය




බූස්ස අලෙවි ගබඩාව
බූස්ස ලී මෝල
බූස්ස ප්‍රදර්ශනාගාරය
අම්බලන්ගොඩ අලෙවි ගබඩාව


මාතර ප්‍රාදේශීය කාර්යාලය
තලල්ල අලෙවි ගබඩාව
තලල්ල ප්‍රදර්ශනාගාරය
හම්බන්තොට අලෙවි ගබඩාව



## නුවරඑළිය ප්‍රාදේශිකය




## පොළොන්නරුව ප්‍රාදේශිකය




## රත්නපුර ප්‍රාදේශිකය






# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

**විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් - 2018**

ඩී.විජේසිරිවර්ධන මහතා - කමිටු සභාපති

එස්.ඒ.ඒ.සතුරුසිංහ මහතා - කමිටු සාමාජික

එම්.වී.කරුණාරත්න මහතා - කමිටු සාමාජික

**කමිටුවේ කාර්යභාරය**

විගණන කමිටුව එහි සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර, මූල්‍ය වාර්තාකරණ සහ විගණන ක්‍රියාවලියෙහි අඛණ්ඩතාව සහතික කිරීම සහ යහපත් අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතිය නඩත්තු කිරීමය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම මාස තුනකට වරක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

1. මාසික මූල්‍ය හා භෞතික කාර්ය සාධනය
2. වාර්ෂික ගිණුම
3. වාර්ෂික අයවැය සහ සංශෝධිත අයවැය
4. අභ්‍යන්තර විගණන සහ විගණකාධිපතිගේ විගණන විමසුම් සහ පිළිතුරු
5. පිරිස් හා පරිපාලන කටයුතු
6. නීතිමය කරුණු
7. කාර්ය මණ්ඩල ණය, අත්තිකාරම් සහ ප්‍රදානය කරන ලද ටෙන්ඩර් වැනි වෙනත් කරුණු

**ඩී. විජේසිරිවර්ධන**
සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව







# ව්‍යාපාරික සාරාංශය


1968 - 2018
සංවත්සරය
50 Anniversary
රාජ්‍ය දැව සංස්ථාව • STATE TIMBER CORPORATION


## ආදායම් ප්‍රවර්ධන ප්‍රවනතා විශ්ලේෂණය






## ලාභ වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය














## නිෂ්පාදනය වර්ධනය වීමේ ප්‍රවනතා විශ්ලේෂණය














## අගය එකතු කිරීම




2016




2017




2018

## ප්‍රාග්ධන වියදම් - 2018

| විස්තරය (රු.මි. 10 වැඩි) | රු. |
|---|---|
| ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - බණ්ඩාරවෙල ප්‍රාදේශිකය | 25,721,558 |
| පන්නිපිටිය කාර්යාල ගොඩනැගිල්ල සහ සේවක නිල නිවස ඉදිකිරීම - කොළඹ ප්‍රාදේශිකය | 12,285,226 |
| තලල්ල ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම - මාතර ප්‍රාදේශිකය | 10,499,908 |
| තිඹොල්කැටිය දැව අලෙවි මධ්‍යස්ථානයේ කාර්යාලය ඉදිකිරීම - රත්නපුර ප්‍රාදේශිකය | 8,275,819 |
| කුඹුක්කන සහකාර ප්‍රාදේශීය කළමනාකාර කාර්යාලය ඉදිකිරීම - මොණරාගල ප්‍රාදේශිකය | 7,977,115 |
| පදියතලාව දැව අලෙවි මධ්‍යස්ථාන කාර්යාලය ඉදිකිරීම - අම්පාර ප්‍රාදේශිකය | 5,925,072 |
| විලන්කුලම දැව අලෙවි මධ්‍යස්ථානයේ දැව අට්ටිමඩුව ඉදිකිරීම - පොළොන්නරුව ප්‍රාදේශිකය | 5,818,931 |
| කල්දෙමුල්ල දැව පරිරක්ෂණ මධ්‍යස්ථානයේ දැව අට්ටිමඩුව ඉදිකිරීම - කල්දෙමුල්ල සංකීර්ණය | 5,345,449 |
| කම්කරු නිල නිවාස ඉදිකිරීම - අම්පාර ප්‍රාදේශිකය | 5,159,443 |
| කොන්ක්‍රීට් යොදා මාර්ගය සැකසීම - රත්නපුර ප්‍රාදේශිකය | 2,577,665 |
| අම්පාර දැව අලෙවි මධ්‍යස්ථානයේ ආරක්ෂක වැට සහ ගේට්ටුව - අම්පාර ප්‍රාදේශිකය | 1,713,889 |

## ආයෝජන

| | 31-12-2018 | 31-12-2017 |
|---|---|---|
| රාජ්‍ය ආයතනවල තාවකාලික අරමුදල් ගිණුම මහජන බැංකුව | 457,962,079 | 431,403,535 |
| මහජන බැංකුව | 740,849,636 | 367,323,062 |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| ලංකා බැංකුව | 831,506,739 | 1,327,057,585 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 187,946,304 | 173,287,242 |





## දශකයක තොරතුරු

| (නිරපේක්ෂ සංඛ්‍යා) | | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු වාර්ෂික ආදායම | රු. '000 | 3,445,141 | 3,616,164 | 3,103,744 | 3,563,390 | 3,213,644 | 3,756,482 | 4,132,052 | 4,522,238 | 4,630,718 | 4,457,024 |
| වාර්ෂික දළ ලාභය | රු. '000 | 1,351,695 | 1,365,285 | 1,237,640 | 1,546,107 | 1,197,615 | 1,453,451 | 1,757,115 | 2,045,090 | 2,075,950 | 1,964,647 |
| භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ලාභය | රු. '000 | 810,612 | 877,623 | 603,499 | 801,681 | 382,337 | 427,222 | 768,699 | 659,732 | 966,804 | 672,433 |
| මුළු සේවක පිරිවැය | රු. '000 | 898,652 | 901,910 | 953,498 | 1,065,052 | 1,117,036 | 1,254,516 | 1,449,746 | 1,789,572 | 1,572,775 | 1,553,598 |
| වාර්ෂික ප්‍රාග්ධන වියදම් | රු. '000 | 112,909 | 237,332 | 180,546 | 162,509 | 332,870 | 115,132 | 244,929 | 113,675 | 94,637 | 116,034 |
| වර්ෂාවසාන ජංගම නොවන වත්කම් | රු. '000 | 1,793,467 | 1,801,988 | 1,739,893 | 1,479,880 | 1,658,535 | 1,654,908 | 1,743,580 | 1,732,640 | 1,894,597 | 1,978,855 |
| වර්ෂාවසාන ජංගම වත්කම් | රු. '000 | 2,079,543 | 2,341,020 | 2,177,892 | 2,929,185 | 3,153,777 | 4,004,860 | 4,115,259 | 3,652,116 | 4,423,105 | 4,541,610 |
| වර්ෂාවසාන ජංගම වගකීම් | රු. '000 | 1,028,979 | 1,034,258 | 497,229 | 804,102 | 1,050,258 | 1,591,991 | 1,480,966 | 897,087 | 1,234,716 | 1,047,668 |
| වර්ෂාවසාන ජංගම නොවන වගකීම් | රු. '000 | 364,553 | 399,057 | 399,953 | 409,030 | 384,831 | 484,649 | 424,854 | 499,373 | 852,292 | 812,441 |
| වර්ෂාවසාන ස්කන්ධය | රු. '000 | 2,479,478 | 2,709,694 | 3,020,602 | 3,195,933 | 3,377,223 | 3,583,129 | 3,953,019 | 3,988,297 | 4,230,694 | 4,660,357 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | රු. '000 | 50,000 | 413,490 | 75,000 | 600,000 | 50,000 | 25,000 | 50,000 | 175,000 | 100,000 | 100,000 |
| වර්ෂාවසාන සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | 2,457 | 2,346 | 2,267 | 2,187 | 2,139 | 2,186 | 2,145 | 2,125 | 2,083 | 2,001 |
| වර්ෂාවසාන අතිරික්ත අරමුදල් ආයෝජන ශේෂය | රු. '000 | 858,717 | 605,235 | 764,328 | 298,546 | 338,010 | 360,227 | 382,550 | 405,727 | 431,404 | 457,962 |


| ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක | | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්කන්ධයට භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය | % | 32.69 | 32.39 | 19.98 | 25.08 | 11.32 | 11.92 | 19.45 | 16.54 | 22.85 | 14.43 |
| මුළු වත්කම්වලට භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය | % | 20.93 | 21.18 | 15.40 | 18.18 | 7.94 | 7.55 | 13.12 | 12.25 | 15.30 | 10.31 |
| ජංගම අනුපාතය | වාර ගණන | 2.02 | 2.26 | 4.38 | 3.64 | 3.00 | 2.52 | 2.78 | 4.07 | 3.58 | 4.33 |
| එක් සේවකයෙකුට සේවක පිරිවැය | රු. '000 | 365.75 | 384.45 | 420.60 | 486.99 | 522.22 | 573.89 | 675.87 | 842.15 | 755.05 | 776.41 |
| ස්කන්ධයට වත්කම් අනුපාතය | වාර ගණන | 0.64 | 0.65 | 0.77 | 0.72 | 0.70 | 0.63 | 0.67 | 0.74 | 0.67 | 0.71 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | % | 9.26 | 5.32 | 7.68 | 3.73 | 3.78 | 3.64 | 6.31 | 0.66 | 3.84 | 3.72 |
| මුළු පිරිවැටුම් වර්ධනය | % | 15.34 | 4.96 | (14.17) | 14.81 | (9.81) | 16.89 | 10.00 | 9.44 | 2.40 | (3.75) |

# අවදානම් කළමනාකරණය

අවදානම් මැනීම හෝ තක්සේරු කිරීම සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කරමින් අවදානම් කළමනාකරණයට රාජ්‍ය දැව සංස්ථාව නිසි පියවරගෙන ඇත. අපගේ ව්‍යාපාරයට කිසියම් අවදානම් තත්වයක් ඇතිවීමට පෙර හානිය අවම කිරීම හෝ සම්පූර්ණයෙන් තුරන් කිරීම සඳහා උපයාමාර්ගික මෙහෙයුම් සහ මූල්‍ය අවදානම් වැනි ආකාර තුනක් යටතේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

අවදානම් කළමනාකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ විභව ගැටළු ආක්‍රමණශීලීව හා ඒවා ඇතිවීමට පෙර හඳුනාගැනීම සහ ඒවාට පිළියම් යෙදීමයි. අවදානම් කළමනාකරණය මඟින් ආයතනයට බලපෑ හැකි අභ්‍යන්තර හා බාහිර බලපෑම් පිළිබඳ නිරන්තර අවදානයෙන් පසුවනු ලැබේ. අඛණ්ඩව අවදානම් සාධක පිළිබඳ සොයාබැලීමක් සිදුකළ යුතුය. එකවර හදිසියේ පැනනඟින අර්බුද කළමනාකරණය හෝ පාලනයකින් තොර තත්වයකට මුහුණදීමට වඩා අවදානම් කළමනාකරණ සැලැස්මක් තිබීම පහසු සහ ලාභදායී වේ.

## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය




## අවදානම් වර්ග

- උපායමාර්ගික අවදානම
- මෙහෙයුම් අවදානම
- මූල්‍ය අවදානම

### 1. උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම යනු ව්‍යාපාරයේ තීරණ අසමත් වීම හෝ අවදානම සංවිධානයේ සමස්ත උපාය මාර්ගයට සෘජුවම බලපායි. මෙයින් අදහස් කරන්නේ විශේෂයෙන් විධායක මට්ටමින් නායකයින්ට සහ කණ්ඩායම්වලට උපායමාර්ගික අවදානම් සෙවීමට හැකි විය යුතු බවයි. මෙම ආකාරයේ අවදානම් ආයතනවලට සැබෑ අනතුරක් වේ. මෙම අවදානම ඉහළ කළමනාකරණයක් සහිත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලැබේ.

### 2. මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම් ක්‍රියාපටිපාටි, පද්ධති හෝ ප්‍රතිපත්ති සහ සේවක දෝෂ වල අසමත් වීම හෝ ප්‍රමාණවත් නොවීම සමඟ සම්බන්ධ වේ. අද ව්‍යාපාර ක්‍රියාවලීන් අඩපණ කරන ඕනෑම සිදුවීමක්.

### 3. මූල්‍ය අවදානම

මූල්‍ය අවදානම යනු සංස්ථාවක් සිය ණය ආපසු ගෙවීමේ වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ අවදානමයි. එය ආයෝජනයකට හෝ ව්‍යාපාරයකට මුදල් අහිමිවීමේ හැකියාවයි.

| අවදානම් වර්ග හා නිරාවරණය | අරමුණු | අවම කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|
| **1. උපාය මාර්ගික අවදානම** | | |
| **1.1 ව්‍යාපාර අවදානම** | ව්‍යාපාරයට නුසුදුසු හෝ දෝෂ සහිත මූලික ආයතනික උපායමාර්ග ස්ථාපිත හෝ ක්‍රියාත්මක කිරීමේ අවදානම වළක්වාගැනීම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාරය ක්‍රියාත්මක වන ආකාරය සහ ආර්ථික තාක්ෂණික පරිසරයන් හි විචලනයන් පිළිබඳ සියලු තොරතුරු අඛණ්ඩව ලබාගැනීමත් ඒවා විශ්ලේෂණය කිරීම සිදුකරනු ලබයි. |
| | | ආදායම සහ වියදම් පාලනය කිරීමේ මෙවලමක් ලෙස අයවැය සහ සැලසුම් අවශ්‍ය ආයතන සඳහා ඉදිරිපත් කොට අනුමැතිය ලබාගැනීම. |
| | | සංවිධානයට පිටතින් බලපාන අවදානම් හඳුනා ගැනීම සඳහා නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් සංවර්ධනය කිරීම |
| **1.2 ව්‍යාපාර නොවන අවදානම** | බාහිර පරිසරයේ අවදානම් අවම කරන අතර ම ව්‍යාපාරය සාර්ථකත්වය පවත්වාගැනීම. | ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ආර්ථික වෙනස්කම්, රජයේ ප්‍රතිපත්ති වෙනස් කිරීම්, දේශගුණික විපර්යාස වැනි බාහිර අවස්ථා සහ තර්ජන ඇගයීම |
| **2. මෙහෙයුම් අවදානම** | | |
| **2.1 වත්කම් හානිවීමේ හා වංචා කිරීමේ අවදානම** | වත්කම්වලට විශේෂයෙන් යන්ත්‍ර බිඳවැටීම්, ගින්නෙන්, සේවකයින්ගෙන් හෝ සොරකම්වලින් සිදුවන හානි නිසා සිදුවන පාඩු අවම කිරීම. | සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් හා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතිය සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම. |
| | | ගොඩනැඟිලි, වාහන සහ පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා පුළුල් රක්ෂණ ආවරණයක් ලබාගැනීම. |
| | | සැලසුම් සහගත හානි වැළැක්වීමේ හා හානියට පෙර නඩත්තු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| **2.2 වෙළඳපොල තරඟකාරීත්වය** | අඩු ගුණාත්මක දැව නිෂ්පාදන ආනයනය කිරීම නිසා වෙළඳපොළ කොටස අහිමිවීම වළක්වා ගැනීම | පවත්නා තත්ත්ව ප්‍රමිතීන් සපුරාලීම සහතික කිරීම. |
| | සංස්ථාවෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවයන්ගේ එනම්, කඳන්, ඉරූ දැව, සිල්පර, විදුලි සම්ප්‍රේෂණ කණු හා අලිවැටකණු ආදියේ විකුණුම් ආදායම වැඩිකිරීම. | විවිධ වෙළඳ දැන්වීම් සහ ප්‍රවර්ධන වැඩසටහන් හරහා සංස්ථා සන්නාමය ශක්තිමත් කිරීම. |
| | | පවත්නා නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා නව සංකල්ප ගෙන ඒම සහ වැඩි ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරගැනීම සහ නිෂ්පාදන පිරිවැය අඩුකිරීම සඳහා නව්‍ය නිෂ්පාදන හා තාක්ෂණය හඳුන්වාදීම සඳහා වෙළඳපොළ පර්යේෂණ සිදුකිරීම. |

| | | |
|---|---|---|
| **2.3 පාරිසරික අවදානම** | මෙහෙයුම් ක්‍රියාවලියේ දී පරිසරයට සිදුවන අහිතකර බලපෑම අවම කිරීම | අදාළ ආයතන සහ බලධාරීන් විසින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලවීම සහ අනුකූලතාවය සහතික කිරීම. |
| | | දැව නාස්තිය අවම කිරීම සහ අපද්‍රව්‍ය නිසි පරිදි පරිසරයට බැහැර කිරීම. |
| | සංස්ථාවේ පාරිසරික ප්‍රතිපත්තියට අනුගතවීම. | තෝරාගත් පාසල්, කාර්යාල, විවිධ වැඩසටහන් සහ කණ්ඩායම් අතර රුක් රෝපණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා රුක් රෝපණයට අදාළ පැළ සහ වෙනත් උපකරණ බෙදාහැරීම. |
| **2.4 සේවක තෘප්තිය** | යහපත් සෞඛ්‍ය හා ආරක්ෂිත පිළිවෙත් තුළින් සේවකයින්ගේ රැකියා තෘප්තිමත්භාවය උපරිම කිරීම | සේවක සෞඛ්‍ය හා ආරක්ෂක සංඛ්‍යාලේඛණ පවත්වාගෙන යාම සහ නිරීක්ෂණය කිරීම සහ නිෂ්පාදන කාර්ය මණ්ඩලයට ආරක්ෂක උපකරණ සැපයීම |
| | | එක් එක් සේවකයා සහ ඔවුන්ගේ පවුල් සඳහා වෛද්‍ය රක්ෂණාවරණයක් සැපයීම. |
| | | මානව සම්පත් අංශය මඟින් සෞඛ්‍ය පරීක්ෂණ සායන, සම්මන්ත්‍රණ වැනි සේවකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සහතික කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම. |
| | ශ්‍රම පිරිවැටුම අඩුකිරීම | සෑම තරාතිරකම සේවකයින් සමඟ යහපත් සහ සුහද සම්බන්ධතාවයක් පවත්වා ගැනීම. |
| | බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සහතික කිරීම | විවිධ ප්‍රතිලාභ ලබාදීම උදා:- සපත්තු දීමනාව, අඩු පොලී අනුපාත ණය, පැමිණීමේ දිරි දීමනා ආදිය. |
| | පුහුණු කිරීම හා උසස් තත්වයේ භාවිතයන් අනුග මනය කිරීම සහ උසස් තත්ත්වයේ සේවකයින් ආකර්ෂණය කරගැනීම හා රඳවා ගැනීම තුළින් අනුවර්තනය වීමේ හැකියාව සහතික කිරීම. | ඒ ඒ අවශ්‍යතාවයන්ට අනුව සේවකයින් සඳහා විවිධ පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| | | රාජ්‍ය ව්‍යාපාරයක් වන නිසා සේවකයින් බඳවාගැනීමේ ක්‍රියාවලිය නිශ්චිත ක්‍රියාපටිපාටියකට අනුකූලව සිදුකිරීමට ක්‍රියාකිරීම. |
| **2.5 පාරිභෝගික තෘප්තිය** | පාරිභෝගිකයන් තෘප්තිමත් කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා හඳුනාගැනීම. | නව්‍ය නිෂ්පාදන හඳුන්වාදීම. |
| | | වෙළඳපොළ සමීක්ෂණ සිදුකිරීම සහ පාරිභෝගික පැමිණිලි විශ්ලේෂණය කිරීම. |
| | | සුදුසුකම්ලත් සහ පළපුරුදු දක්ෂ සේවකයින් ආකර්ෂණය කරගැනීම |
| | | පාරිභෝගික තෘප්තිමත්භාවය හඳුනාගැනීම සඳහා තත්ත්ව පාලන ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම |
| | නවෝත්පාදනය | සංස්ථාවේ පර්යේෂණ හා සංවර්ධන ඒකකය සංවර්ධනය තුළින් නව්‍ය නිෂ්පාදන ක්‍රම හෝ ක්‍රියාවලීන් හඳුනාගැනීම සඳහා යොමුකිරීම. |
| **2.6 තාක්ෂණික හා නිෂ්පාදන ගුණාත්මකභාවය පිළිබඳ අවදානම** | වර්තමාන තාක්ෂණික ක්‍රම හා තත්ත්ව ප්‍රමිතීන් සමඟ කටයුතු කිරීම තුළින් නාස්තිය හා යල්පැනයාම වළක්වා ගැනීම. | පවත්නා යන්ත්‍ර වෙනුවට තාක්ෂණික වශයෙන් දියුණු යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කිරීමට දිගුකාලීන සැලසුම් සකස් කිරීම. |
| | ප්‍රමිතීන්ට අනුකූල නොවන නිෂ්පාදනය අවම කිරීම. | අපගේ නිෂ්පාදන දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බවට අදාළ බලධාරීන්ගෙන් හා ආයතනවලින් තත්ව සහතික ලබාගැනීම. |
| | | අභ්‍යන්තර හා බාහිර විගණන පැවැත්වීම. |
| | | තාක්ෂණික අංශය දියුණුව සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම. |
| | | දැව නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ආයතනය තුළ අවශ්‍ය රසායනාගාර පහසුකම් සපයනු ලැබේ. |



| | | |
|---|---|---|
| **2.7 නෛතික හා නියාමන අවදානම** | ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම නිසා සිදුවිය හැකි පාඩු අවම කිරීම. | ව්‍යවස්ථාපිත හා නියාමන ආයතනවල අවශ්‍යතා වලට අනුකූලවීම. |
| | නියාමන ගැටළුවල වෙනස්වීම් හේතුවෙන් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | අධ්‍යක්‍ෂවරුන්ගේ හා අදාළ නිලධාරීන්ගෙන් විධිමත් උපදෙස් ලබාගැනීම. |
| | නෛතික පරිසරයේ වෙනස්කම්වලට සාර්ථකව මුහුණදීම සඳහා ශක්තිමත්, ඵලදායී හා නම්‍යශීලී ව්‍යුහයන් සංවර්ධනය කිරීම. | නෛතික ප්‍රතිපත්ති ප්‍රවණතා අධීක්ෂණය කිරීම. |
| **3. මූල්‍ය අවදානම** | | |
| **3.1 ද්‍රවශීලතා අවදානම** | ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වාගැනීම. | ණය බැඳීම සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ඇති බව සහතික කිරීම. |
| | | නිතර මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම සහ අවශ්‍ය පරිදි මුදල් සහ මුදල් සමාන වත්කම් පවත්වාගෙන යාම. |
| **3.2 පොලී අනුපාත අවදානම** | පොලී අස්ථාවරත්වයේ අහිතකර බලපෑම අවම කිරීම. | සංස්ථාවේ ආයෝජන සඳහා හැකි උපරිම පොලී අනුපාතයක් ලබාගැනීම සඳහා බැංකු සමඟ සාකච්ඡා කිරීම. |
| | | සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කොට පිරිවැය අවම වන සහ දේශීය පොලී අනුපාතවල අහිතකර උච්චාවචනයන් වළක්වා ගැනීම සඳහා සැපයුම් වලට අදාලව ඉහල වට්ටම් ලබාගැනීම. |
| **3.3 ණය අවදානම** | ණයගැතියන්ගේ පැහැර හැරීම් හා සම්බන්ධ අවදානම අවම කිරීම | ණයගැතියන් නිසි ලෙස සමාලෝචනය කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා සංස්ථාව පුළුල් ප්‍රතිපත්තියක් පවත්වාගෙන යයි. |
| | | ප්‍රධාන වශයෙන් භාණ්ඩ විකුණුම් මුදල් පදනම මත සිදුකෙරෙන අතර ණයට විකුණුම් රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව සිදුකෙරේ. |
| | | ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම් පිළිබඳ වඩා සැලකිලිමත්ව කටයුතු කරනු ලැබේ. |
| | | ගනුදෙනුකරුවන්ගේ ණයගරුකභාවය සහතික කිරීම සහ ගනුදෙනුකරුවන් පදනම් කරගත් නිශ්චිත ණය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීම. |
| | | ණය තත්ත්වය සහ එකතුකිරීම නිතිපතා අධීක්ෂණය කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම. |
| **3.4 හුවමාරු අවදානම** | ආනයන හා අපනයන සඳහා විදේශ මුදල් අනුපාතවල උච්චාවචනයන්ට නිරාවරණයවීම අවම කිරීම. | උච්චාවචනයන් සමීපව නිරීක්ෂණය කර ඒ අනුව ආනයන හා අපනයන සැලසුම් කිරීම. |
| **3.5තොග කළමනාකරණ අවදානම** | යල්පැනගිය තොගවල පාඩු අවම කිරීම. | මාසිකව පැවැත්වෙන නිෂ්පාදන සැලසුම් රැස්වීම්වලදී අයවැය සහ විකුණුම් පුරෝකථනයන් මත පදනම්ව මාසික නිෂ්පාදන සැලසුම් කිරීම. |
| | සෙමින් චලනය වන තොගවල පාඩු අවම කිරීම. | සෙමින් චලනය වන නිෂ්පාදන තොග අඩුකිරීම සඳහා විකුණුම් ප්‍රවර්ධනයන් සිදුකිරීම. උදා:- “ප්‍රසාද අභිමානී”, අවුරුදු සහ නත්තල් විකුණුම් ප්‍රවර්ධන වැඩසටහන් |

| | | |
|---|---|---|
| | තොග රඳවාගැනීමේ පිරිවැය අවම කිරීම. | නිෂ්පාදිත පාරිභෝගිකයා අතට පත්වන තුරු නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය හා තත්ත්වය සහතික වන අයුරින් කටයුතු කිරීම. |
| | | තොග වරින්වර සමාලෝචනය කිරීම සහ සෙමින් චලනය වන තොග සඳහා නිසි පරිදි ක්‍රියාකිරීම. |
| | | කපා ඉවත්වෙන කොටස් Finger joint නිෂ්පාදන කටයුතු සඳහාත්, බොයිලේරු ක්‍රියාත්මක කිරීමේ දර සඳහාත් භාවිතා කරනු ලබයි. |
| **3.6 ප්‍රාග්ධන ආයෝජනය** | ආයෝජන අභිම්වීමේ අවදානම අවම කිරීම. | වත්කම්වල ආයෝජනය ප්‍රාග්ධන අයවැයට අනුව කාලෝචිතව නිසි පරිදි සැලසුම් කර ඇත. |
| | | වත්කම් උපරිම භාවිතයට ගැනීම. |
| | | රජය සතු ව්‍යාපාරයක් බැවින් ප්‍රාග්ධන ආයෝජන සම්බන්ධව දැඩි ක්‍රියාකාරී පිළිවෙතක් අනුගමනය කිරීම. |





# ආයතනික සමාජ වගකීම

ශ්‍රී ලංකාවේ විශ්වාසදායක දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන සැපයුම්කරු ලෙස රාජ්‍ය දැව සංස්ථාව වගකිව යුතු ආයතනික පුරවැසියෙකි. ප්‍රජාවට ආපසු ලබාදීම ගැන අපි විශ්වාස කරමු. අපගේ ආයතනික සමාජ වගකීම් වැඩසටහන් තිරසාර සංවර්ධන ඉලක්කවල දැඩි රාමුව යටතේ සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ. එම පරමාර්ථය මනසේ තබා ගනිමින්, එහි ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය සමඟ හොඳ සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීමට සහ වගකීමෙන් යුතුව කළමනාකරණය කිරීමට අපි ක්‍රියාශීලීව කටයුතු කරන්නෙමු. අපගේ දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සැලසුම් කර ඇති ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති ගණනාවක් අපි ආරම්භ කරමු.




### සදාචාරාත්මක වගකීම

සදාචාරාත්මක ආයතනික සමාජ වගකීම් වැඩසටහන් මඟින් සේවකයින්ගේ සිට ගනුදෙනුකරුවන් දක්වා සියලුම ඇල්මැති පාර්ශවයන්ට සාධාරණත්වය සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

- 50 වන සංවත්සරයට සමගාමීව සංවිධානය කරන ලද වැඩසටහන්
  - සංස්ථා සේවකයින්ගේ විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන දරුවන් සඳහා රු.2,150,000 ක් වටිනා ශිෂ්‍යත්ව 43 ක් පිරිනමන ලදී.
- දැව සංස්ථාවේ කාර්යමණ්ඩල සාමාජිකයින් සහ විශ්වවිද්‍යාල සිසුන් විසින් ඉදිරිපත් කරන ලද දැව හා දැව කර්මාන්තයට අදාළ පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කරන ලදී. ලිපිවල සාරාංශ විස්තර (මාතෘකාව) පහත දැක්වේ.

| පර්යේෂණ ලිපිවල මාතෘකාව | |
|---|---|
| **Staff Members** | **University students** |
| Identify the Strength Grade for Finger Jointed Timber Species. | Identification of Timber Species Using Physical & Anatomical Features. |
| Evaluation the Authenticity of Wood Species in Sri Lankan Market. | Determination of Same Wood Properties and its uses in 50 lesser knows Timber in Sri Lanka. |
| Strength Classification for Sri Lankan Wood Species. | Estimation Harvesting Cost of Pine Plantation by Private Sector & State Timber Corporation. |
| Investigation of the Most Suitable Glue Type for Finger-Joints Production in Sri Lanka. | Development of Timber Classification System for Finger-Joints Production Using Strength Properties. |

## සේවකයින් පුහුණු කිරීමේ වැඩසටහනග

<table>
<tr><th colspan="2">දේශීය පුහුණු වැඩමුළු</th><th colspan="2">විදේශ පුහුණු වැඩමුළු</th></tr>
<tr><td>දැව තාක්ෂණ පුහුණු ආයතනය මඟින් (TTIT)</td><td>799,651.00</td><td rowspan="3">මුළු පිරිවැය</td><td rowspan="3">1,910,310.88</td></tr>
<tr><td>වෙනත් ආයතන මඟින්</td><td>1,200,075.00</td></tr>
<tr><td>මුළු පිරිවැය</td><td>1,999,726.00</td></tr>
<tr><td colspan="4"></td></tr>
<tr><th>පුහුණු වැඩසටහන් කාණ්ඩය</th><th>වැඩසටහන් ගණන</th><td colspan="2" rowspan="5">විවිධ ක්ෂේත්‍රවල සේවකයින්ගේ ඵලදායිතාව කාර්යක්ෂම හා ඔවුන් පෙළඹවීම වර්ධනය කිරීම සඳහා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම.</td></tr>
<tr><td>TTTI ආයතනය මඟින් සපයන ලද පුහුණු වැඩසටහන්</td><td>09</td></tr>
<tr><td>වෙනත් ආයතන</td><td>40</td></tr>
<tr><td>වැඩිදුර අධ්‍යයනය සඳහා පහසුකම් (පශ්චාත් උපාධි, උපාධිය, ඩිප්ලෝමාව ආදිය)</td><td>14</td></tr>
<tr><td>මුළු වැඩසටහන</td><td>63</td></tr>
<tr><td colspan="4"></td></tr>
<tr><td>පුහුණු සඳහා සහභාගී වූ සේවකයින් සංඛ්‍යාව</td><td>1,107</td><td>පුහුණු සඳහා සහභාගී වූ සේවකයින් සංඛ්‍යාව</td><td>08</td></tr>
</table>

## පරාර්ථකාමී / ප්‍රජා වගකීම

පරාර්ථකාමී සමාජ වගකීම් හැකි තරම් සදාචාරාත්මක ක්‍රමෝපායන් ක්‍රියාත්මක වීමෙන් ඔබ්බට ගොස් සමාජය සක්‍රියව යහපත් කිරීම සඳහා සම්බන්ධ වේ.

- "තුරුජන සිසු බැංකුව" වැඩසටහනට දායකවීම.
  - කෑගල්ලේ පාසැල් 10 ක් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසැල් 4 ක් සඳහා කෘෂිකාර්මික උපකරණ කට්ටල 14 ක් සහ දැව හා වෘක්ෂලතා සම්බන්ධ පොත් කට්ටලයක් පරිත්‍යාග කිරීම.
  - පාසැල් 10 ක වන රෝපණය ඒ ආශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

- අධ්‍යයන ආයතන 09 ක සිසුන් 325 දෙනෙකු සඳහා රජයේ දැව සංස්ථාවේ කර්මාන්තශාලා/ යන්ත්‍රාගාර නැරඹීම් සහ දේශන සඳහා පහසුකම් සැපයීම.
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන තිරසාර ලෙස භාවිතා කිරීම පිළිබඳව පාසැල් ගුරුවරුන් 1200 ක් පමණ දැනුවත් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළු 12 සඳහා දායකත්වය ලබාදුන් අතර, ඔවුන් හට දැව ආශ්‍රිත පත්‍රිකා 4000 කට වැඩි ප්‍රමාණයක් බෙදා දෙන ලදී.
- ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ ශ්‍රවණාගාරය සහ වේදිකාව අළුත්වැඩියා කිරීමෙන් සංස්ථාව "එක්ස්-බෑන්" ප්‍රදර්ශනයට දායක වූ අතර, ප්‍රදර්ශනය සඳහා වෙළෙඳ ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී.



- "අඩසියවසක පියසටහන්" මැයෙන් අධ්‍යාපන ලිපි ඇතුළු සඟරා මුද්‍රණය කර සමාජය තුළ නොමිලේ බෙදාහරින ලදී.
- සම්මන්ත්‍රණ සහ සමුළුවට දායකවීම
  - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වන විද්‍යා හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2018 දී සංවිධානය කරන ලද වන විද්‍යා සම්මන්ත්‍රණයට දායක විය.
  - රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය විසින් සංවිධානය කරන ලද International Symposium on Agriculture & Environment (ISAE) 2018 සම්මන්ත්‍රණයට දායක විය.

## පාරිසරික වගකීම

2018 වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් පහත සඳහන් පාරිසරික කටයුතු සිදුකරන ලදී. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය විසින් පවත්වනු ලබන "වනරෝපා" වැඩසටහනට ක්‍රියාකාරී දායකත්වය සැපයීම.

- රාජ්‍ය දැව සංස්ථාව තවාන් පැළ 130,000 ක් පමණ නිෂ්පාදනය කර "වනරෝපා" වැඩසටහන යටතේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන සහ පෞද්ගලික ආයතන අතර නොමිලේ බෙදාහරිනු ලැබීය.
  - 2018 වසරේ මන්නාරම දිස්ත්‍රික්කයේ පවත්වන ලද ජාතික "වනරෝපා" සමාරම්භක උත්සවයට දායකත්වය සැපයීම.
  - 2018 "වනරෝපා" ප්‍රධාන උත්සවය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නක්කාවත්ත ජාතික පාසැල කේන්ද්‍ර කරගනිමින් සංවිධානය කර ඇත.

- 2018 ලෝක පරිසර දිනයට සමගාමීව පවත්වන ලද වැඩසටහන්
  - 2018 ලෝක පරිසර දිනය නිමිත්තෙන් කොස් ගස් වගාකිරීමේ වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගම්මාන සමඟ මෙල්ලකන්ද වන රක්ෂිතයේ දී සංවිධානය කරන ලදී.
  - මාතර සුජාතා විද්‍යාලය අසල ඇලවේල්ල මාර්ගය අවට රුක් රෝපණ වැඩසටහනක් සංවිධානය කළ අතර, පැළ 100ක් පමණ රෝපණය කර එම පැළ සඳහා ගස් ආවරණ ස්ථාපිත කළේය.
  - අම්පාර හි හරිත ජන පදනමට ගස් ආවරණ 50 ක් ද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගස් ආවරණ 20 ක් ද නිකුත් කරන ලදී.
  - රජයේ ආයතන සඳහා පැළ නිකුත් කිරීම. (කෑගල්ල ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිංහ රෙජිමේන්තු පුහුණු පාසැල හා උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය, යාපනය)

## ආර්ථික වගකීම

ආර්ථික තීරණ ගනු ලබන්නේ එකවර සමාජයට හා ව්‍යාපාරවලට ඔවුන් දක්වන සමස්ථ බලපෑම සලකා බැලීමෙනි. එබැවින් ආර්ථික වගකීම් මඟින් තිරසාර භාවිතයන් හි යෙදෙන අතරම ව්‍යාපාර මෙහෙයුම් වැඩිදියුණු කළ හැකිය.

- ස්කන්ධභාග, මෙහෙයුම් බදු, ආදායම් බදු සහ විශේෂ බද්ද ලෙස රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට රු.මිලියන 2199 ක දායකත්වයක් සපයා දුනි.
- රාජ්‍ය දැව සංස්ථාව බොහෝ පිරිසකට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ලබාදෙන අතර, ජාතික ආර්ථික සංවර්ධනයට උපකාරී වන රටේ විරැකියාව පිළිබඳ ගැටළුව අවම කිරීමට වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.
- රාජ්‍ය දැව සංස්ථාව කලාපීය සංවර්ධනය ප්‍රවර්ධනය කරන අතර, ඌණ සංවර්ධිත හා පසුගාමී ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල පිහිටවීමෙන් කලාපීය විෂමතා ඉවත් කිරීමට කටයුතු කරයි. මෙම ප්‍රදේශවල ව්‍යාපාර පිහිටවීම මහජනතාවට විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් සපයා දෙන ලදී.
- ශ්‍රී ලංකාවේ දැව සත්‍යාපනය සඳහා නීතිමය බලයක් රාජ්‍ය දැව සංස්ථාවට ඇති අතර, හරිත ගොඩනැඟිලි සහතික කිරීමේ ක්‍රියාවලිය දැව සංස්ථාව විසින් සිදුකරන අතර, දැව වාර්තා 216 ක් නිකුත් කර ඇති අතර, සාම්පල් 382 ක් 2018 වර්ෂය තුළ පරීක්ෂා කරන ලදී.

| දැව සහතිකය | වාර්තා ගණන |
|---|---|
| හඳුනාගැනීමේ වාර්තාව | 133 |
| ශක්ති වාර්තාව | 08 |
| තෙතමනය අන්තරගත වාර්තාව | 30 |
| Density වාර්තාව | 26 |
| CCB ප්‍රතිකාර වාර්තාව | 07 |
| බෝරෝන් ප්‍රතිකාර වාර්තාව | 12 |
| මුළු වාර්තා ගණන | 216 |








# විගණකාධිපතිගේ වාර්තාව

50 1968 - 2018 සංවත්සරය Anniversary

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයි ඊ එන් /සී/එස් ටී සී/1/9/215    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 මැයි ... දින

සභාපති කාර්යාලය
0 4 JUN 2019
රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාව
05 JUN 2019
සාමාන්‍යාධිකාරී කාර්යාලය

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

**රාජ්‍ය දැව සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---------------------------------------------------------------------------------------------------

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති.

පිටපත් : 1. ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය.

2. ලේකම්, මුදල් අමාත්‍යාංශය.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk





ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } අයිඊඑන් /සී/එස් ටී සී/1/9/215    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 මැයි ... දින

සභාපති කාර්යාලය
0 4 JUN 2019
රාජ්‍ය දැව ...

රාජ්‍ය දැව සංස්ථාව
05 JUN 2019
සාමාන්‍යාධිකාරී කාර්යාලය

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

**රාජ්‍ය දැව සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

රාජ්‍ය දැව සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කළ අගය මත බදු ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 59,871,133 වූ අතර අදාල බදු වාර්තා අනුව රු. 63,841,605 වුයෙන් රු.3,970,482 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) කල්දෙමුල්ල අට්ටිමඩුවේ සවිකරන ලද ප්‍රමිතියෙන් බැහැරවූ යකඩ රාක්ක නැවත සකස් කිරිම තුල හඳුනාගන්නා ලද අලාභ වටිනාකම රු. 834,124 ක් කල්දෙමුල්ල ගෘහ භාණ්ඩ සංකිර්ණයේ අර්ධ නිමි ගොඩනැගිලි ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 වන වගන්ති ප්‍රකාරව වෙනත් ණයහිමි යටතේ දක්වා ඇති ගණුදෙනුකරු අත්තිකාරම්, මුදලට විකුණුම් අත්තිකාරම් හා මුදල් විකුණුම් පාලන යන ගිණුම් 03 හි එකතුව රු. 161,776,032 ක හර ශේෂයක් හිලව් කර දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවලින් දැක්වෙන ණයහිමි ශේෂයහි සත්‍ය තත්ත්වය පිළිඹිබු නොවන බව නිරික්ෂණය විය

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 61 වන වගන්තිය අනුව වත්කමක් සඳහා භාවිතා කරන ක්ෂය ක්‍රමය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදී වත්කම් සමාලෝචනය කල යුතු අතර වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරිමේ අපේක්ෂිත රටාවේ සැලකිය යුතු වෙනසක් වේ නම් එම වෙනස් වූ රටාව නිරූපනය වන ලෙසට ක්ෂය ක්‍රමය වෙනස් කල යුතුය. එවැනි වෙනසක් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වූ වෙනසක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාර ගිණුම් ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 79 වන වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ගේ අවශ්‍යතාවය මත පහත තොරතුරු හෙලිදරව් කර නොතිබුණි.

(i) තාවකාලිකව අක්‍රිය දේපල ,පිරියත හා උපකරණවල ධාරණ අගය.

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 05 ප්‍රකාර ක්‍රියාකාරි භාවිතයේ විශ්‍රාම ගන්වා ඇති සහ විකිණීම සඳහා තබා ඇති සේ වර්ගීකරණය නොකල දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය.







(iii) පිරිවැය අකෘතිය භාවිතා කරන විට දේපල, පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට සාධාරණ වටිනාකම.

(ඊ) අර්ධ නිමි ගොඩනැගිලි ලෙස දක්වා ඇති රු. 2,035,694 වූ කැප්පෙටිපොල සංකීර්ණයේ ද්විත්ව නිල නිවාසයේ ලිපිගොනුව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය







තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගය කරන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනායාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 571(2) | වර්ෂ 2 ක් ඉක්මවූ ගැන් නේයිල් තැන්පතු රු. 1,258,635 ක් වර්ෂ 2 ක සිට 5 දක්වා අතර කාලයක් ඉක්මවූ පසු ආරම්භක තැන්පතු රු. 133,800 ක් , කොන්ත්‍රාත් රඳවා ගැනිමේ රු. 2,513,001 ක් හා ටෙන්ඩර් තැන්පතු රු. 7,783,104 ක් නිරවුල් කිරිමට හෝ මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව ආදායමට ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1978 අංක 41 දරන නගරික සංවර්ධන අධිකාරිය පනත | 2017 නොවැම්බර් 15 වන දින අනුරාධපුර ප්‍රාදේශිය කාර්යාලය ඉදිකිරිම ආරම්භ කර තිබුණද ඊට අදාල සැලසුම් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අනුමැතිය 2018 දෙසැම්බර් 03 වන දින විටද ලබාගෙන නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

සංස්ථාවේ අරමුණු අතරින් කෘෂි කාර්මික නිෂ්පාදන, වේවැල් ආනයනය යන අරමුණු ඉටුකර ගැනිමට සංස්ථාව කටයුතු කර නොමැති අතර අපේක්ෂිත පරිදි දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවියද සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදි සිල්පර දැව අපනයනයද සිදු කර නොතිබුණි. එමෙන්ම දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරිම සංස්ථාවේ අරමුණක් වුවද එම අරමුණු ඉටු කර ගැනිම සඳහා සංස්ථාව කටයුතු කර නොතිබුණි.







- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) වැඩබිම් සඳහා වෙන්කරන ලද අත්තිකාරම්වලින් 2013 සිට 2017 වර්ෂයන් අතර කාලය තුල ලබාදුන් රු. 10,833,500 ක් හා 2013 වර්ෂයට පෙර ලබාදුන් රු. 1,142,000 ක් 2019 අප්‍රේල් වන විටත් පියවා නොතිබුණි.

(ආ) 1983 වර්ෂයේ සිට පෞද්ගලික සමාගමකින් අයවිය යුතු රු. 11,871,954 ක්, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු රු. 207,910,689 ක්, පෞද්ගලික ආයතනයෙන් රු. 1,687,042 ක් හා පුද්ගලයන් දෙදෙනකුගේන් අයවිය යුතු රු. 777,353 ක් වර්ෂ 04 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණද ඒවා අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයෙන් සහ වන සංරක්ෂක දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු විදුලිය, ජලගාස්තු හා ගොඩනැගිලි කුලී පිළිවෙලින් රු. 1,661,487ක් හා රු. 31,333,241 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අනුරාධපුර රාජ්‍ය දැව සංස්ථා ප්‍රාදේශිය කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස ඉදිකිරිමේදි ගිවිසුම් අනුව 2018 මාර්තු 21 දින නිම කල යුතු වුවත් එලෙස සිදු කර නොතිබුණි. 2018 අගොස්තු 25 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණද 2018 දෙසැම්බර් 03 වන විටත් ඉදිකිරිම් නිම කර නොතිබුණි. ඒ අනුව 2018 අගෝස්තු 25 දිනෙන් පසු දිනකට රු. 15,000 බැගින් රු. 1,500,000 ක ප්‍රමාද දඩ මුදල් අයකල යුතු වුවද එම මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. නියමිත කාලයට නිම නොකිරිම හේතුවෙන් කාර්යාල බදු කුලි ලෙස රු. 375,000 ක් වැය කිරිමට සිදු වී තිබුණි. කාර්ය සාධන සුරක්ෂණයේ (Performance Bond) හා රක්ෂණ ආවරණයේ කාලය දිර්ඝ කිරිමට කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2017 සැප්තැම්බර් 13 වන දින ඉදිකිරිම් ආරම්භ කරන ලද පදියතලාව ගබඩා නිලධාරී කාර්යාලයේ ඉදිකිරිම් කටයුතු 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කර නොතිබුණි

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති




# වාර්ෂික ගිණුම්

50 1968 - 2018 සංවත්සරය Anniversary

## ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| පිරිවැටුම | 2 | 4,069,020,266 | 4,253,774,266 |
| විකුණුම් පිරිවැය | 3 | (2,104,372,869) | (2,177,824,205) |
| **මෙහෙයුම් මත දළ ලාභය** | | **1,964,647,397** | **2,075,950,061** |
| වෙනත් ආදායම් | 6 | | |
| මෙහෙයුම් | 6.2 | 73,199,174 | 103,163,513 |
| මෙහෙයුම් නොවන | 6.1 | 314,804,979 | 273,779,849 |
| **මුළු ශුද්ධ ආදායම** | | **2,352,651,550** | **2,452,893,423** |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 4 | (789,340,223) | (680,617,770) |
| පරිපාලන වියදම් | 5 | (890,878,473) | (805,471,293) |
| **භාණ්ඩාගාර බදුවලට පෙර ශුද්ධ ලාභය** | | **672,432,854** | **966,804,360** |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | | (100,000,000) | (100,000,000) |
| **භාණ්ඩාගාර බදුවලට පසු ලාභය** | | **572,432,854** | **866,804,360** |
| වර්ෂය සඳහා ආදායම් බදු | 7 | (250,372,289) | (301,062,806) |
| **ආදායම් බදුවලට පසු ලාභය** | | **322,060,565** | **565,741,554** |

## විස්තීරණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **ආදායම් බදු පසු ලාභය** | | **322,060,565** | **565,741,554** |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික අතිරික්ත/ඌණතා | 17 | 107,601,910 | (323,413,595) |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | **107,601,910** | **(323,413,595)** |
| **මුළු විස්තීරණ ආදායම්** | | **429,662,475** | **242,327,959** |

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට

| | | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 8 | 983,985,526 | 980,517,535 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 1,384,486 | 1,443,873 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 10 | 7,061,289 | 6,577,016 |
| භාණ්ඩාගාර තැන්පත් | | 2,966,000 | 2,966,000 |
| සේවක ඇප තැන්පත් | | 67,948,050 | 63,941,048 |
| ආයෝජන | 11.1 | 646,408,384 | 605,190,777 |
| පෙර ගෙවුම් සේවක ප්‍රතිලාභ | | 106,106,944 | 67,459,232 |
| විලම්භිත බදු වත්කම් | 7.2 | 77,240,757 | 96,644,503 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | | 85,753,849 | 69,856,596 |
| **මුළු ජංගම වත්කම්** | | **1,978,855,286** | **1,894,596,581** |
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ තොග | 12 | 1,628,071,793 | 1,513,147,565 |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ | 13 | 1,127,960,087 | 868,402,923 |
| ස්ථිර තැන්පතුවල ආයෝජන | 11.2 | 1,572,356,375 | 1,694,380,646 |
| මුදල් හා බැංකු ශේෂය | 14 | 213,221,840 | 347,174,014 |
| **මුළු ජංගම වත්කම්** | | **4,541,610,096** | **4,423,105,148** |
| **මුළු වත්කම්** | | **6,520,465,382** | **6,317,701,729** |
| | | - | |
| ස්කන්ධය හා බැරකම් | | | |
| **ස්කන්ධය හා සංචිත** | | | |
| අනුමත ප්‍රාග්ධනය | | 75,000,000 | 75,000,000 |
| | | | |
| දායක ප්‍රාග්ධනය | 15 | 41,503,668 | 41,503,668 |
| අයභාර සංචිත | | 4,277,346,100 | 3,857,127,941 |
| | | **4,318,849,768** | **3,898,631,609** |
| සේවක ණය චක්‍රීය අරමුදල | 16 | 341,506,845 | 332,062,529 |
| **මුළු ස්කන්ධය** | | **4,660,356,613** | **4,230,694,138** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදල | 17 | 744,492,569 | 788,350,624 |
| සේවක ඇප තැන්පත් | | 67,948,050 | 63,941,048 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **812,440,619** | **852,291,672** |
| ජංගම බැරකම් | | | |
| ආදායම් බදු | 18 | 361,558,026 | 268,225,025 |
| ණය හිමියෝ සහ උපචිත වියදම් | 19 | 686,110,124 | 966,490,894 |
| **මුළු ජංගම බැරකම්** | | **1,047,668,150** | **1,234,715,919** |
| **මුළු බැරකම්** | | **1,860,108,769** | **2,087,007,591** |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **6,520,465,382** | **6,317,701,729** |

රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධ මෙම ප්‍රකාශනය 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධානවලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරි**
රාජ්‍ය දැව සංස්ථාව

පිටු අංක 75 සිට 81 දක්වා වන ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 82 සිට 92 දක්වා වන ගිණුම් සටහන් මෙම ගිණුම් ප්‍රකාශවල කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර සහ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

**සභාපති**
රාජ්‍ය දැව සංස්ථාව.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

**අධ්‍යක්ෂ**

දිනය: 07.03.2019



**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය**

| | දායක ප්‍රාග්ධනය රු. | සේවක ණය චක්‍රීය අරමුදල රු. | රඳවාගත් ලාභ රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | **41,503,668** | **243,052,926** | **3,703,809,585** | **3,988,366,179** |
| වර්ෂය තුළ ගැලපීම් | - | 81,000,000 | (81,000,000) | - |
| වර්ෂය සඳහා ලාභය | - | - | 565,741,554 | 565,741,554 |
| වර්ෂය සඳහා සේවක ණය පොළිය | - | 8,009,603 | (8,009,603) | - |
| වෙනත් විස්තීරණ ආදායම් | - | - | (323,413,595) | (323,413,595) |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | **41,503,668** | **332,062,529** | **3,857,127,941** | **4,230,694,138** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 322,060,565 | 322,060,565 |
| වර්ෂය සඳහා සේවක ණයපොළිය ගැලපුම | - | 9,444,316 | (9,444,316) | - |
| වෙනත් විස්තීරණ ආදායම් | - | - | 107,601,910 | 107,601,910 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **41,503,668** | **341,506,845** | **4,277,346,100** | **4,660,356,613** |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු මුදල් | 3,907,223,870 | 4,600,374,990 |
| සැපයුම්කරුවන්ට හා සේවකයන්ට ගෙවූ මුදල් | (4,034,358,377) | (3,600,892,262) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල්** | (127,134,507) | 999,482,728 |
| ආදායම් බදු | (137,635,542) | (254,881,998) |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | (100,000,000) | (100,000,000) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(364,770,049)** | **644,600,730** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදීගැනීම් | (116,034,227) | (94,637,473) |
| ජීව විද්‍යාත්මක වත්කම් සංවර්ධනය | (484,273) | (534,746) |
| ආයෝජන | 80,806,664 | (673,224,639) |
| ආයෝජනවලින් ලද ආදායම | 256,478,250 | 214,393,281 |
| වත්කම් විකිණීමෙන් ලද මුදල් | 16,504,399 | 3,718,263 |
| ආයෝජන විකිණීමෙන් ලද මුදල් | - | 30,000,000 |
| කෙරීගෙන යන වැඩ | (15,897,253) | (44,094,965) |
| සේවක ණය චක්‍රීය අරමුදල | 9,444,316 | 8,009,603 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **230,817,875** | **(556,370,675)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **-** | **-** |
| | | |
| **මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ අගය වැඩිවීම/අඩුවීම** | **(133,952,174)** | **88,230,055** |
| | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් (සටහන් 14) | 347,174,014 | 258,943,959 |
| | | |
| **වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් (සටහන 14)** | **213,221,840** | **347,174,014** |



# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1.1 වාර්තාකරණ ආයතනය

### 1.1.1 සංස්ථාපනය
1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, 1968, අප්‍රේල් මාසයේ දී රාජ්‍ය දැව සංස්ථාව සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදි.

### 1.1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලද දිනය
2018, ජුනි මස 27 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ දී සම්මත කරගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුකූලව 2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

### 1.1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා නිකුත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

### 1.1.4 සේවක සංඛ්‍යාව.
2018 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 2,001 කි. (2017 වර්ෂයේ 2,083 කි)

## 1.2 ඉදිරිපත්කිරීමේ පදනම

### 1.2.1. අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් ප්‍රකාශ කරන ලද නිර්දේශිත රීතීන් වලට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) වලට අනුකූලව සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට හා එම කාලපරිච්ඡේදයෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම් සඳහා සටහන් පිළියෙල කර ඇත.

### 1.2.2 අගය කිරීමේ පදනම
ලැබිය යුතු සේවක ණය සහ වෙළඳ ණයගැතියන් සාධාරණ අගයට ගිණුම්වල පෙන්වා ඇති අතර, ඒ හැර අනෙකුත් අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙනය.

### 1.2.3 භාවිතා වන හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මුදල් ඒකකය
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සංස්ථාවේ ගනුදෙනු කරන මුදල් ඒකකය වේ. විශේෂයෙන් සඳහන් කොට නොමැති නම්, සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියල දක්වා වටයා ඉදිරිපත් කර ඇත.

### 1.2.4 ඇස්තමේන්තු හා නිගමන
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වයට නොයෙකුත් ඇස්තමේන්තු, නිගමන හා උපකල්පන පදනම් කරගැනීමට සිදුවන අතර, ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කරන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල අගයන් කෙරෙහි බලපෑම් ඇති කරවයි. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන අතීත අත්දැකීම් සහ යම් අවස්ථාවන් යටතේ සාධාරණයැයි විශ්වාස කරන විවිධ වෙනත් කරුණු මත පදනම් වී ඇත. සත්‍ය ප්‍රතිඵලය, ඇස්තමේන්තු නිගමනයන් හා තීරණවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා උපකල්පන නිරතුරුවම සමාලෝචනය කරනු ලැබේ.

සංශෝධනය කරනු ලබන ගණකාධිකරණ ඇස්තමේන්තු එම ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හා ඒවා බලපානු ලබන ඉදිරි කාලපරිච්ඡේද සඳහා ගලපනු ලැබේ.

### 1.2.5 විදේශ විනිමය ගනුදෙනු

විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනුයේ ගනුදෙනු සිදුවූ දිනට පැවති විනිමය වටිනාකම අනුව වේ.

### 1.2.6 බදුකරණය

ගිණුම් ප්‍රකාශවල වාර්තා වන ආදායම් සහ වියදම් පදනම් කරගෙන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ පසුකාලීන සංශෝධන වලට අනුකූලව ගණනය කිරීමෙන් පසුව ආදායම් බදු සඳහා වෙන්කිරීම් කර ඇත.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල ගිණුම් කාලපරිච්ඡේදය තුලදී අඛණ්ඩව භාවිතා කොට ඇත.

### 1.3.1 වත්කම් සහ වටිනාකම ගණනය කිරීම

#### 1.3.1.1 දේපල පිරියත හා උපකරණ

##### 1.3.1.1.1 හඳුනාගැනීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවූ වටිනාකම අඩුකර අගය කර ඇත. (ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සාධාරණ අගය මත) වත්කම මිලදී ගැනීමේදී එය සෘජුව ආරෝපිත වියදම් දේපල, පිරියත හා උපකරණ පිරිවැයට ඇතුළත්වේ. දේපල, පිරියත හා උපකරණවල වෙනස් කොටස්වල විවිධ ඵලදායී ජීවකාල ඇත්නම් ඒවා දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම ලෙස ගිණුම්ගත කරයි. සියලු දේපල, පිරියත හා උපකරණ පළමුව පිරිවැයට හඳුනාගනී.

##### 1.3.1.1.2 වත්කම් විකිණීමෙන් ඇති වූ ලාභ/අලාභ

වත්කම් විකිණීමෙන් ඇති වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේදී ලැබීම් හා වත්කමේ ධාරණ වටිනාකමේ වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම විකුණනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.

##### 1.3.1.1.3 පසු පිරිවැය

ස්ථාවර ස්වභාවයෙන් ව්‍යාපාරය පවත්ගෙන යාමට හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාව වර්ධනය කිරීම සඳහා වත්කම් පවරාගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වැයවන පසු වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබන අතර, එවැනි වියදම් වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමෙන් හඳුනාගැනේ. එමෙන්ම දේපල හා උපකරණවල එදිනෙදා නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශනයෙන් යෙදවූ වටිනාකම් ලෙස හඳුනාගැනේ.

##### 1.3.1.1.4 ඉවත් කිරීම්

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී හෝ ඒවා පාවිච්චි කිරීම තුළින් ඉදිරි ප්‍රතිලාභයක් අත්නොවන විට ඒවායේ ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ගිණුම් වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ වත්කම් ඉවත් කිරීමේදී උද්ගත වන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගලපනු ලබන අතර, ලාභ ආදායමක් ලෙස සලකනු නොලැබේ.



##### 1.3.1.1.5 ක්ෂයවීම

දේපළ, පිරියත හා උපකරණවල සියලුම අංගයන් එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සරල රේඛීය පදනම මත විස්තීරණ ආදායම් ප්‍රකාශනයට කපාහරිනු ලබයි. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර, අදාල ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ.

| | |
|---|---|
| ස්ථිර ගොඩනැගිලි | 2.5% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 30% |
| යන්ත්‍රෝපකරණ | 10% |
| වාහන | 20% |
| මාර්ග හා දුම්රිය මාර්ග | 5% |
| බදු ඉඩම් | 5% |
| මාර්ග ඉදිකිරීම් | 10% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| විවිධ වත්කම් | 20% |
| පරිගණක | 20% |
| විදුලි උපකරණ | 10% |
| මෙවලම් හා උපකරණ | 20% |
| ඉඩම් සංවර්ධන | 10% |

### 1.3.1.2 නොනිම් වැඩ

ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණ කරගත නොහැකි වූ ප්‍රාග්ධන ආයෝජනවලට අදාල ප්‍රාග්ධන වියදම් අදාල වර්ෂයේ නොනිම් වැඩ යටතේ දක්වා ඇති අතර, වැඩ සම්පූර්ණ වී පරිහරණයට සුදුසු තත්වයට පැමිණි පසු ඒවා දේපල පිරියත හා උපකරණ යටතේ දක්වනු ලැබේ.

### 1.3.1.3 අස්පෘෂ්‍ය වත්කම්

අස්පෘෂ්‍ය වත්කම්වලට පරිඝනක මෘදුකාංග මිලදිගැනීම සඳහා වැය වූ පිරිවැය ඇතුලත් වේ. එමෙන්ම මෙවැනි අස්පෘෂ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකිනම් සහ එහි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබීමේ ප්‍රවණතාවයක් පවතී නම් පමණි. අස්පෘෂ්‍ය වත්කම් පිරිවැයෙන්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම් අඩුකර වටිනාකම අගය කර ඇත. විශේෂිත වත්කමකට අදාලව පසුව දරනු ලබන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම් දැරීම හේතුවෙන් අදාල වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ වර්ධනයට එය පිටුවහලක් වන්නේ නම් පමණි. ක්‍රමක්ෂය සරල රේඛීය පදනම මත ඇස්තමේන්තු ගත පස් අවුරුදු ජීව කාලය පුරා කපාහරිනු ලබයි.

### 1.3.1.4 ජීව විද්‍යාත්මක වත්කම්

"ජීව විද්‍යාත්මක වත්කම්" පරිණත ජීව විද්‍යාත්මක වත්කම් සහ අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. පරිණත ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වන්නේ ඵලදාව නෙලාගන්නා මට්ටමට පත්ව ඇති හෝ නිරන්තර ඵලදාව ලැබෙන තත්වයට පත්ව ඇති අයිතමයන් ය. අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකෙන්නේ ඵලදාව නෙලාගන්නා තත්වයට පත් නොවූ අයිතමයන්ය.

ජීව විද්‍යාත්මක වත්කම් ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් සහ පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් විකිණීම සඳහා හෝ නෙලාගැනීම සඳහා තබා නොගන්නා ඒවා වන අතර, එම අයිතමයන් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ලබාගැනීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කරනු ලැබේ. පරිභෝජනයම ජීව විද්‍යාත්මක වත්කම් ගණයට දැව ලබාගැනීමට පාලනය කරනු ලබන ගස් මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වලින් ඵලදාව නෙලාගන්නා

ලද කෘෂිකාර්මික නිෂ්පාදන මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් විකුණනු ලබන අයිතමයන් අයත්වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් සේ ආයතනය ඒවා වර්තමානයේ දී පාලනය කරනු ලබන විට හා එම අයිතමයන් සමඟ බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ව්‍යාපාරය තුළට ජනනයවීම භව්‍ය වන්නේ නම් හා ඒවායේ පිරිවැය හෝ සාධාරණ අගය විශ්වසනීය පරිදි මැනිය හැකිවන විට ජීව විද්‍යාත්මක වත්කම් ආයතනය විසින් හඳුනාගනී. දැව ලබාගැනීමට පාලනය කරන ගස් මුල්වරට හඳුනාග න්නා අතර, සෑම වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදීම ශ්‍රී.ල.ගි.ප්‍ර 41 ප්‍රකාරව ඒවා සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩු කළ පසු ලැබෙන අගයට නිරූපණය කෙරේ.

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක් පරිණත වීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගත වන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිනාමය සිදුවීමට අවුරුදු 10ක කාලයක් ගත වන බව සඳහන් කළ හැක. ජීව විද්‍යාත්මක පරිනාමය සිදුවන කාලය අතර තුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත් එම කාල පරිච්ඡේදය තුල සමාන වන බව උපකල්පනය කර ඇත.

### 1.3.1.5 මූල්‍ය උපකරණ

#### 1.3.1.5.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

සංස්ථාව විසින් පළමුව ණය මුදල, ලැබිය යුතු මුදල් හා තැන්පතු එළඹී දිනය මත පදනම් ව හඳුනාගැනීම සිදුකරනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හා අලාභ හරහා සාධරණ අගය මත නම් කරන ලද වත්කම් අතුළුව) සංස්ථාව කොන්ත්‍රාත් විධිවිධාන වලට අදාල පාර්ශවයක් බවට පත් වූ ගණුදෙනු සිදුවූ දිනය මත පදනම් ව හඳුනාගැනීම් සිදුකරනු ලබයි. වත්කම් කල්පිරීමේ දී මූල්‍ය ප්‍රවාහ සදහා ඇති ගිවිසුම්ගත හිමිකම් මත සංස්ථාව වත්කම් නැවත හඳුනාගැනීම හෝ මූල්‍ය වත්කම් ගනුදෙනු වලදී වත්කමට අදාල ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය සමග සැලකිය යුතු සියලුම අවදානම් මාරු කරනු ලබයි.

##### 1.3.1.5.1.1. ණයට දුන් සහ අයවිය යුතු වත්කම්

ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ක්‍රියාකාරී වෙළඳපොළෙන් උපුටාගත නොහැකි මූල්‍ය වත්කම් ණය හා ලැබීම් වේ. මෙම වත්කම් සාධාරණ අගයට එයට අදාල සෘජු වියදම් එකතු කිරීමෙන් පසු ලැබෙන අගය මත මූලික හඳුනාගැනීම සිදුකරනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හානිකරන අලාභ ඉවත් කිරීමෙන් පසුව ඵලදායී පොළී ක්‍රමය යොදාගනිමින් එම වත්කම් නැවත හඳුනාගැනීම සිදුකරනු ලබයි. ණය හා ලැබීම් වෙළඳ හා වෙළඳ නොවන ලැබීම් වලින් සමන්විත වන අතර, සේවක ණය ද ඇතුළත් වේ. මුදල් හා මුදල් සමාන වත්කම් මුදල් ශේෂයන්ගෙන් හා ඊක්ෂණ තැන්පතු වලින් සමන්විත වන අතර, ඊක්ෂණ තැන්පතු ඇතුළත් කරනු ලබන්නේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ අරමුණ සදහාය.

### 1.3.1.6 ආයෝජන

#### 1.3.1.6.1 ස්ථිර තැන්පතු ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

#### 1.3.1.6.2 දිගුකාලීන ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

#### 1.3.1.6.3 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ආයෝජන

මෙම ආයෝජනයන් සිදුකර ඇත්තේ රාජ්‍ය දැව සංස්ථාවේ සේවකයින්ට නිවාස ණය පහසුකම් සැලසීම සඳහාය.

#### 1.3.1.6.4 අපහායනය

මූල්‍ය වත්කමක අගය අඩුවන බවට විෂය මූලික සාක්ෂි ඇතිදැයි එක් එක් වාර්තාකරණ දිනක දී ඇගයීමකට ලක්කිරීම සිදුකොට එසේ අගය අඩුවීමෙන් දැරීමට සිදුවන අලාභය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

### 1.3.1.7 වෙළෙඳ තොග

වෙළෙඳ තොග අගයකරනු ලැබ ඇත්තේ පිරිවැය හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පරිත්‍යාග දැව තොග ද, අගය කොට ඇත්තේ පිරිවැය (තොග වර්තමාන ස්ථානයට සහ වර්තමාන තත්වයට ගෙනඒම සඳහා දරන ලද පිරිවැය) හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කරන පදනමට වන අතර පිරිවැයට, බඩුතොග ප්‍රවර්තන තත්වයට හා ස්ථානයට ගෙනඒමට දරන ලද සියලු වියදම් ඇතුලත්ය. නිෂ්පාදන සම්බන්ධයෙන් මේ වනවිටදී පිරිවැයට සියලු සෘජු වියදම් ද සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටම මත පදනම් වන නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ද ඇතුළත් ය. අවශ්‍ය අවස්ථාවන් හිදී යල්පැනගිය, සෙමින් අලෙවි වන හා දෝෂ සහිත බඩුතොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත. තොග හානිවීම් සඳහා 15% ක සාමාන්‍ය ප්‍රතිපාදනයක් සලසා ඇත.

## 1.3.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ ගැනෙනුයේ ඉල්ලූ වහා ගෙවිය යුතු ගෙවීම් හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. ජංගම නොවන වගකීම් ලෙස ගැනෙනුයේ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරකට වැඩිකාලයක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. මූල්‍ය ප්‍රකාශනවල සියලුම හඳුනාගෙන ඇති වගකීම් ගිණුම්ගත කර ඇත.

### 1.3.2.1 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වගකීම්

වෙළඳ හා අනෙකුත් කටයුතු සදහා ගෙවීම් අදාල පිරිවැය අනුව සදහන් කර ඇත.

### 1.3.2.2 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත අනුව අඛණ්ඩව වර්ෂ 05කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් විශ්‍රාම පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. කෙසේ වෙතත් සියලුම සංස්ථා සේවකයින් වෙනුවෙන් වර්ෂ 2018 දෙසැම්බර් 31 දිනට අවසන්කර ඇති සේවා කාලය හා අවසන්වරට ලැබූ වැටුප පදනම් කරගෙන සේවක විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

### 1.3.2.3 අසම්භාව්‍ය වත්කම් හා වගකීම් සදහා වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස, වර්තමානයේ විශ්වාසනීයව මැනිය හැකි නීතිමය හෝ සාධාරණීයකරණය කළ හැකි වගකීමක් පවතී නම් හා එම වගකීම පියවීම සදහා ආර්ථික ප්‍රතිලාභ ගලායෑමක් නියත වශයෙන්ම සිදුවේ නම් පමණක් සංස්ථාව මගින් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි.

මුදලින් මැනිය හැකි සියලුම වගකීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර, අනෙකුත් වගකීම් හෙළිදරවු කර ඇත.

බගවන්තලාව වැපල්ටන් වාණිජ තුනී කිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රජයට පාඩු සිදුවූ බවට දන්වන ලද අතර, පරීක්ෂණවලදී හෙළිදරව් වූ සමහර කරුණු හේතුවෙන් තවමත් නිශ්චිත නිගමනයකට එළඹිය නොහැකි බැවින් සංස්ථාවේ නිලධාරීන් සමග එක්ව එම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට

වනසංරක්‍ෂණ ජනරාල්තුමා තීරණය කොට ඇත.

වනසංරක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දැව සංස්ථාවට එරෙහිව දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් උසාවියට රඹකැන්ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේ දී සිදුවූ අක්‍රමිකතා හේතු කොට ගෙන "බී" වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. මේ දිනවල නඩු විභාගය දෙහිඅත්තකන්ඩිය උසාවියේ විභාග වෙමින් පවතී'

2006 සිට 2012 කාල සීමාව තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි හා සේවක භාරකාර අරමුදලෙහි දායකත්වය ගණනය කිරීමේදී ජීවන වියදම් නොසලකා ඇති බව දක්වමින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට එරෙහිව චෝදනා ගොනුකර ඇත. මෙම තත්වය තුල සංස්ථාව විසින් 15% ක සේව්‍යාගේ දායකත්වය හා ඊට අදාල දඩ මුදල් ද, කම්කරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර, 10% සේවකයාගේ දායකත්වය සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය දැව සංස්ථාව සාකච්ඡා කරමින් සිටින අතර, මෙම 10% ක මුදල සහ අධි භාරය ගෙවීම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට නොමැත.

ලංකා බැංකු ස්ථාවර තැන්පතු ගිණුම් අංක :81353078, 82509320, 82509291, එරෙහිව බැංකු ඇපකරයන් නිකුත් කර ඇත.

### 1.3.3 ආදායම් හඳුනාගැනීම

අයභාරය හඳුනාගනු ලබන්නේ එමඟින් සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි හා එය විශ්වාසදායී ලෙස මැනිය හැකිවිටදීයි. දැව විකිණීමෙන් ලද ආදායම ගණනය කර ඇත්තේ දැව විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු මුදල, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ සඳහා දෙනුලබන සහන ආදිය සැලකිල්ලට යොමුකිරීමෙන් සාධාරණ වටිනාකම් පදනමටය. රාජ්‍ය දැව සංස්ථාවේ සහ වනසංරක්ෂ දෙපාර්තමේන්තුවේ සේවකයින් හට 25% ක සහනදායී මිලක් යටතේ දැව නිකුත් කරන අතර, එම වියදම් සුභසාධක පහසුකම් වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර ඇත.

#### 1.3.3.1 විකුණුම් ආදායම

භාණ්ඩ විකුණුම් ආදායම ලෙස පිළිගනු ලබන්නේ එම භාණ්ඩවල හිමිකාරිත්වය, අවදානම් සහ ප්‍රතිලාභ භාණ්ඩ මිලදීගත් තැනැත්තා වෙත පැවරුණු අවස්ථාවේදීය. එනම්, භාණ්ඩ බෙදාහැරීමෙන් පසුව විකුණුම් ආදායමක් ලෙස සලකනු ලැබේ.

#### 1.3.3.2 බදු ආදායම

උපචිත පදනම යටතේ බදු ආදායම ගණනය කෙරේ.

### 1.3.4 වියදම් හඳුනාගැනීම

වර්ෂය තුළ ලබා ඇති ලාභය ගණන් බැලීමේදී වසර තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩුකර ඇත. අලුත්වැඩියා සහ නවීකරණයට අදාල වියදම් එය දැරූ වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හරකර ඇත.

#### 1.3.4.1 ආදායම් බදු

ප්‍රවර්තන හා විලම්භිත බදු වලින් ආදායම් බදු සමන්විත වේ. ස්කන්ධයෙන් හෝ වෙනත් විස්තීරණ ආදායම් තුලින් ඍජුව හඳුනාගන්නා අයිතම වලට අදාල ප්‍රමාණය හැර ප්‍රවර්තන හා විලම්භිත බදු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාග නී.

වාර්තා කරන දිනට බලපවත්වන බදු අනුපාත හා පූර්ව වාර්ෂය වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් උපයෝගී කරගෙන, වර්ෂයේ බදු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බදු මුදල ප්‍රවර්තන බදු ලෙස හඳුනා ගනී.



ආදායම් බදු අනුපාතය 28% ක් වේ.

මූල්‍ය වාර්තාකරණය සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ ශේෂය සහ බදු මුදල අතර තාවකාලික වෙනස ලබාගැනීම සඳහා වගකීම් ක්‍රමය භාවිතය මගින් විලම්භිත බදු මුදල ගණනය කෙරේ. මූල්‍ය තත්වය ප්‍රකාශන දිනට බලපවත්වන බදු අනුපාත භාවිතයෙන් වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ නිරවුල් කළ යුතු ශේෂය හෝ අපේක්ෂිත උපලබ්ධි මදුල මත පදනම්ව විලම්භිත බදු මුදල ගණනය කෙරේ.

අනාගත වත්කම්වල පරිභෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ දී බදු ලාභයක් ලැබීමේ සම්භාවිතාවයක් පවතී නම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හඳුනාගැනේ. වත්කමට අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් ලබාගත නොහැක්කේ නම් එම ප්‍රමාණයට විලම්භිත බදු වත්කම පහත හෙලනු ලැබේ.

#### 1.3.4.2 ස්කන්ධභාග ගෙවීම

2018 වසර සඳහා ස්කන්ධභාගය ගණනය කර ඇත්තේ හෙලා ඇති දැව පරිමාව අනුවය.

#### 1.3.4.3 පිරිවැය වෙන් කිරීම

දැව හුවමාරු අගය මත දැව පිරිවැය හා දැව ඉරුම්හල්වල පරිවර්තන පිරිවැය බෙදාවෙන් කරනු ලබන අතර, අදාල ඒකකය වෙත ප්‍රවාහනය කිරීමේ කුලී අගය මත යාන්ත්‍රික වැඩපොලේ පිරිවැය වෙන්කරනු ලබයි.

### 1.3.5 මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසුව සිදුවීම්

මූල්‍ය තත්ව ප්‍රකාශනය සකස් කළ දිනයට පසුව පැනනැගී සියලු සැලකිය යුතු සිද්ධීන් සැලකිල්ලට ගෙන, මූල්‍ය ප්‍රකාශවල අදාල සටහන් යටතේ නිසි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

### 1.3.6 සේවක ණය චක්‍රීය අරමුදල

මෙම අරමුදල නිර්මාණය කොට ඇත්තේ සංස්ථාවේ සේවකයන්ට ණය ලබාදීමේ අරමුණිනි. සේවක ණයපොලී ආදායම වෙනත් ආදායම් යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා, ආදායම් බදු අඩුකිරීමෙන් පසු ශුද්ධ පොලී ආදායම සේවක ණය චක්‍රීය අරමුදලට මාරු කරනු ලැබේ. මෙමගින් සේවක ණය චක්‍රීය අරමුදල ගොඩනැංවෙන අතර, එමගින් ණය ලබාදීම අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයට සීමාවේ.

### 1.3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඍජු ක්‍රමයට අනුව පිළියෙල කර ඇත. මුදල් සහ මුදල් වලට සමාන වත්කම්වලට වටිනාකම වෙනස්වීමේ අවධානමට යටත්ව ඉක්මණින් මුදල් වලට මාරුකර ගතහැකි ඉහළ ද්‍රවශීලීතාවයක් ඇති කෙටිකාලීන ආයෝජන ඇතුලත් වේ. මුදල් සහ මුදල් සමාන වත්කම් වලට අතැති මුදල්, බැංකු ශේෂ සහ බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

## ගිණුම් සඳහා සටහන්

| 02. පිරිවැටුම | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| කඳන් - රජයේ ඉඩම්වලින් ලද | 2,506,101,785 | 2,775,603,532 |
| කඳන් - පුද්ගලික ඉඩම්වලින් ලද | 2,730,380 | 33,237,974 |
| ඉරුඳැව | 210,754,441 | 207,698,281 |
| ඉරුඳැව - ආනයනය කරන ලද | 17,924,309 | 48,620,691 |
| සිල්පර - පුද්ගලික ඉඩම්වලින් ලද | 76,821,781 | 91,685,336 |
| සිල්පර - රජයේ ඉඩම්වලින් ලද | 368,879,938 | 41,654,406 |
| සිල්පර - අපනයනය | - | 1,138,372 |
| විදුලි සම්ප්‍රේෂණ කණු රජයේ ඉඩම්වලින් ලද | 76,445,394 | 136,382,640 |
| විදුලි සම්ප්‍රේෂණ කණු පුද්ගලික ඉඩම්වලින් ලද | 28,451,439 | 36,313,002 |
| අලිවැට කණු | 106,247,028 | 75,465,961 |
| වෙනත් | 23,681,431 | 19,181,410 |
| වන අපරාධ දැව | 42,695,379 | 78,284,437 |
| පරිත්‍යාග දැව | 383,190,733 | 405,112,249 |
| ගෘහභාණ්ඩ | 308,063,371 | 389,044,488 |
| **දළ පිරිවැටුම** | **4,151,987,409** | **4,339,422,777** |
| ජාතිය ගොඩනැඟීමේ බදු | (82,967,143) | (85,648,511) |
| **ශුද්ධ පිරිවැටුම** | **4,069,020,266** | **4,253,774,266** |

| 03. විකුණුම් පිරිවැය | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| දැව ගබඩා හා මංසල ගබඩා | 1,117,549,353 | 1,205,030,916 |
| දැව පරිරක්ෂණාගාර | 468,608,497 | 347,215,178 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 247,673,924 | 268,939,817 |
| මංසල විකුණුම් | 270,541,094 | 356,638,294 |
| **එකතුව** | **2,104,372,869** | **2,177,824,205** |

| 04. විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| දැව ගබඩා | 667,804,998 | 616,166,666 |
| දැව පරිරක්ෂණාගාර | 73,322,880 | 13,434,188 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 38,990,428 | 40,567,396 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 9,221,917 | 10,449,520 |
| **එකතුව** | **789,340,223** | **680,617,770** |

| 05. පරිපාලන වියදම් | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| දැව පරිරක්ෂණාගාර | 24,643,237 | 20,425,440 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 82,796,814 | 71,971,576 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 776,571,426 | 706,407,258 |
| සංචාරක බංගලා | 6,866,996 | 6,667,018 |
| **එකතුව** | **890,878,473** | **805,471,293** |

| 06. වෙනත් ආදායම් | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| **6.1 මෙහෙයුම් නොවන ආදායම්** | | |
| පොළී ආදායම් - ආයෝජන | 289,884,669 | 246,148,133 |
| විදේශ විනිමය හුවමාරු (අලාභ) | 39,790 | 4,091 |
| ගොඩනැගිලි කුලිය | 10,307,944 | 13,060,102 |
| පාරිතෝෂික අධිවෙන්කිරීම | 195,069 | - |
| සේවක ණය පොළිය | 14,377,507 | 14,567,524 |
| **එකතුව** | **314,804,979** | **273,779,849** |
| **6.2 මෙහෙයුම් ආදායම** | | |
| විවිධ ආදායම් | 25,469,611 | 62,725,858 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | 1,156,477 | 800,692 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | 15,552,429 | 3,015,776 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 21,189,929 | 14,410,259 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 6,184,020 | 18,442,082 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | 2,093,164 | 1,159,228 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | 1,553,544 | 2,609,617 |
| | **73,199,174** | **103,163,513** |
| **එකතුව** | **388,004,153** | **376,943,362** |

## 6.3 වෙනත් ආදායම් විශ්ලේෂණය 2018

| ආදායම් මූලාශ්‍ර | ඒකක | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | අලෙවි ගබඩා | දැව පදම් කිරීමේ ඒකක | ගෘහභාණ්ඩ නිෂ්පාදන ඒකක | ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලය | ඉරුම්හල් | සංචාරක බංගලා | එකතුව |
| **මෙහෙයුම් නොවන ආදායම් 6.1** | | | | | | | |
| පොළී ආදායම - ආයෝජන | - | - | - | 289,884,669 | - | - | 289,884,669 |
| විදේශ විනිමය හුවමාරු ලාභ / (අලාභ) | - | - | - | 39,790 | - | - | 39,790 |
| ගොඩනැගිලි කුලිය | - | - | 86,000 | 10,221,944 | - | - | 10,307,944 |
| පාර්තෝෂික අධි වෙන්කිරීම | 11,014 | 26,914 | - | - | 157,142 | - | 195,069 |
| සේවක ණය පොළිය | - | - | - | 14,377,507 | - | - | 14,377,507 |
| | **11,014** | **26,914** | **86,000** | **314,523,909** | **157,142** | **-** | **314,804,979** |
| **මෙහෙයුම් ආදායම් 6.2** | | | | | | | |
| විවිධ ආදායම් | 365,168 | - | 1,000 | 24,017,540 | - | 1,085,903 | 25,469,611 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | - | - | - | 1,156,477 | - | - | 1,156,477 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | - | - | - | 15,552,429 | - | - | 15,552,429 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 17,844,124 | 3,073,674 | 272,131 | - | - | - | 21,189,929 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 3,207,722 | - | 2,976,298 | - | - | - | 6,184,020 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | - | - | - | 2,093,164 | - | - | 2,093,164 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | - | - | - | 1,553,544 | - | - | 1,553,544 |
| | 21,417,015 | 3,073,674 | 3,249,428 | 44,373,154 | - | 1,085,903 | 73,199,174 |
| **එකතුව** | **21,428,028** | **3,100,588** | **3,335,428** | **358,897,063** | **157,142** | **1,085,903** | **388,004,153** |

| 07. ආදායම් බදු | | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **ප්‍රවර්තන බදු වියදම්** | (7.1) | | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු | | 230,724,261 | 390,212,803 |
| පෙර වර්ෂය සඳහා අධි / ඌණ වෙන්කිරීම් | | 244,282 | (314) |
| | | **230,968,543** | **390,212,489** |
| **විලම්භිත බදු වියදම්** | (7.2) | | |
| තාවකාලික වෙනස්වීම්වල ප්‍රවර්තනය හා මූලාරම්භය | | 19,403,746 | (89,149,683) |
| | | **19,403,746** | **(89,149,683)** |
| **වර්ෂය සඳහා බදු අයකිරීම්** | | **250,372,289** | **301,062,806** |

| 7.1 ප්‍රවර්තන වර්ෂයේ ලාභය සඳහා ආදායම් බදු | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| බදු පෙර ලාභය | 672,432,854 | 866,804,360 |
| සමාහාර ඉඩනොදෙන වියදම් | 349,148,224 | 208,624,269 |
| සමාහාර ඉඩදෙන වියදම් | (512,135,980) | (522,958,134) |
| ව්‍යාපාරික ලාභය | 509,445,098 | 552,470,495 |
| ව්‍යාපාරික නොවන ආදායම් | 314,570,120 | 273,775,759 |
| බදු අයකළ හැකි ආදායම් | 824,015,218 | 826,246,253 |
| ආදායම් බද්දෙන් 28% | 230,724,261 | 231,348,951 |
| බෙදාහැරිය හැකි ලාභය මත ලාභාංශ බදු | - | 158,863,852 |
| **එකතුව** | **230,724,261** | **390,212,803** |

| 7.2 විලම්භිත බදු | තාවකාලික වෙනස | බදු බලපෑම (වත්කම්)/වගකීම් |
|---|---|---|
| | රු. | රු. |
| 2018 ජනවාරි 01 වන දිනට ශේෂය | (345,158,938) | (96,644,503) |
| වසර තුළ උත්පාදනය වූ මුදල | 69,299,093 | 19,403,746 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(275,859,845)** | **(77,240,757)** |
| දේපළ, පිරියත හා උපකරණවල තාවකාලික වෙනස | 468,632,725 | 131,217,163 |
| විශ්‍රාම පාර්තෝෂික අරමුදලේ තාවකාලික වෙනස | 744,492,570 | 208,457,920 |
| ඉදිරියට ගෙන ආ බදු අලාභය | - | - |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **275,859,845** | **77,240,757** |

## 08. දේපල පිරියත හා උපකරණ

| විස්තරය | පිරිවැය | | | | ක්ෂය | | | | 2018.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම | 2017.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2018.12.31 දිනට ශේෂය | 2018.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම | වසර සඳහා අයකිරීම් | 2018.12.31 දිනට ශේෂය | | |
| ඉඩම් | 59,057,146 | - | - | 59,057,146 | - | - | - | - | 59,057,146 | 59,057,146 |
| ඉඩම් සංවර්ධනය | 38,996,948 | 3,685,647 | - | 42,682,595 | 17,350,129 | - | 3,561,262 | 20,911,392 | 21,771,204 | 21,646,819 |
| ගොඩනැගිලි | 798,800,942 | 77,020,144 | - | 875,821,086 | 200,161,324 | - | 18,736,631 | 218,897,955 | 656,923,131 | 598,639,618 |
| දැව අට්ටිමඩු හා වෙනත් ගොඩනැගිලි | 32,992,208 | 11,821,610 | - | 44,813,818 | 23,478,726 | - | 6,795,840 | 30,274,566 | 14,539,252 | 9,513,482 |
| මාර්ග හා දුම්රිය මාර්ග | 18,421,732 | 2,577,665 | - | 20,999,397 | 8,140,540 | - | 781,959 | 8,922,498 | 12,076,898 | 10,281,192 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 696,638,216 | 2,193,394 | 23,080,678 | 675,750,932 | 548,442,280 | 22,262,720 | 25,895,902 | 552,075,462 | 123,675,470 | 148,195,935 |
| බදු අයිති ඉඩම් හා ගොඩනැගිලි | 148,311 | - | - | 148,311 | 148,311 | - | - | 148,311 | - | - |
| මාර්ග ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ | 60,450 | - | - | 60,450 | 60,450 | - | - | 60,450 | - | - |
| මෙවලම් හා උපකරණ | 6,069,425 | 110,122 | - | 6,179,547 | 5,642,867 | - | 219,486 | 5,862,353 | 317,194 | 426,558 |
| විදුලි උපකරණ | 20,318,339 | 2,270,810 | | 22,526,149 | 11,418,404 | - | 1,465,094 | 12,883,499 | 9,642,651 | 8,899,936 |
| වාහන | 614,345,583 | - | 11,485,201 | 602,860,382 | 530,464,345 | 11,391,473 | 38,613,714 | 557,686,586 | 45,173,796 | 83,881,238 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 50,123,326 | 10,028,085 | - | 60,151,411 | 35,110,094 | - | 5,506,909 | 40,617,002 | 19,534,409 | 15,013,232 |
| කාර්යාලීය උපකරණ | 35,193,058 | 1,235,836 | 19,000 | 36,409,893 | 29,892,817 | 12,399 | 1,830,455 | 31,710,872 | 4,699,022 | 5,300,241 |
| පරිගණක හා උපාංග | 67,769,331 | 4,422,387 | 210,975 | 71,980,743 | 53,696,133 | 177,291 | 5,721,500 | 59,240,341 | 12,740,402 | 14,073,198 |
| විවිධ වත්කම් | 29,785,884 | 508,160 | - | 30,294,044 | 24,196,944 | - | 2,262,149 | 26,459,093 | 3,834,951 | 5,588,940 |
| පෙර නිමැවුම් ව්‍යුහ | 4,938,333 | - | - | 4,938,333 | 4,938,333 | - | - | 4,938,333 | - | - |
| බදු අයිති ඉඩම් - රත්නපුර | 680,300 | - | - | 680,300 | 680,300 | - | - | 680,300 | - | - |
| **එකතුව** | **2,474,339,532** | **115,810,861** | **34,795,854** | **2,555,354,539** | **1,493,821,997** | **33,843,884** | **111,390,899** | **1,571,369,012** | **983,985,526** | **980,517,534** |

* වාර්තා කරන දිනය වන විට පිරිවැය රු. 1,142,632,416/-ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත හා උපකරණ ප්‍රමාණයක් සංස්ථාව සතු වේ.

## 09. අස්පෘශ්‍ය වත්කම්

| විස්තරය | පිරිවැය | | | | ක්‍රමක්ෂය | | | | 2018.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම | 2017.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2018.12.31 දිනට ශේෂය | 2018.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම | වසර සඳහා අයකිරීම් | 2018.12.31 දිනට ශේෂය | | |
| පරිගණක මෘදුකාංග | 5,189,843 | 223,368 | - | 5,413,211 | 3,745,970 | - | 282,754 | 4,028,725 | 1,384,486 | 1,443,873 |
| **එකතුව** | **5,189,843** | **223,368** | **-** | **5,413,211** | **3,745,970** | **-** | **282,754** | **4,028,725** | **1,384,486** | **1,443,873** |

## 10. ජීව විද්‍යාත්මක වත්කම්

| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භක ශේෂය | 6,577,016 | 6,042,270 |
| නැවත වගාකිරීම් හෝ සංවර්ධනය සඳහා දරණ ලද වියදම් | 484,273 | 534,746 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **7,061,289** | **6,577,016** |

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක් පරිනතවීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගතවන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිණාමය සිදුවීමට අවුරුදු 10ක කාලයක් ගතවන බවත් සඳහන් කළ හැකිය. ජීව විද්‍යාත්මක පරිණාමය ගතවන කාලය අතරතුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත්, එම කාල පරිච්ඡේදය තුළ සමාන බව උපකල්පනය කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවට අයත් තේක්ක වගාවන් තවම අවුරුදු 4ක අපරිණත වගාවන් කාණ්ඩයට අයත් වේ. එම වගාවන් පරිණත බවට පත්වන විට ඒ සඳහා දැරිය යුතු ආයෝජන පිරිවැයක් වෙතොත් එම අගය ද ඇතුළුව මුළු අගය අපරිණත ගිණුම්වලින් පරිණත ගිණුම් තුළට මාරුකරනු ලැබේ.

පුලියන්කුලම, මැදවච්චිය, සෙවනපිටිය හා විහීතගම යන ස්ථානවල සංස්ථාව සතු තේක්ක වගාවක් පවත්වාගෙන යනු ලබයි.

## 11. ආයෝජන

### 11.1 ආයෝජන - දිගු කාලීන

| දෙසැම්බර් 31 දිනට | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| **ස්ථාවර තැන්පතුවල ආයෝජනය - දිගු කාලීන** | | |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අරමුදල් ගිණුම | 457,962,079 | 431,403,535 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 187,946,304 | 173,287,242 |
| | **645,908,384** | **604,690,777** |
| **කොටස්වල ආයෝජනය** | | |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| | **500,000** | **500,000** |
| **එකතුව** | **646,408,384** | **605,190,777** |

### 11.2 ආයෝජනය - කෙටි කාලීන

| දෙසැම්බර් 31 දිනට | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| **ස්ථාවර තැන්පතුවල ආයෝජනය** | | |
| මහජන බැංකුව | 740,849,636 | 367,323,062 |
| ලංකා බැංකුව | 831,506,739 | 1,327,057,585 |
| **එකතුව** | **1,572,356,375** | **1,694,380,646** |

**12. තොග**

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| වෙළඳ බඩු තොගය | 1,692,019,805 | 1,527,107,769 |
| තොග හානිවීම් සඳහා වෙන්කිරීම් | (227,468,459) | (198,077,293) |
| | **1,464,551,346** | **1,329,030,475** |
| කෙරීගෙන යන වැඩ | 34,245,861 | 32,421,998 |
| ගබඩා ද්‍රව්‍ය සහ අමතර කොටස් | 87,391,677 | 83,836,328 |
| පරිරක්ෂණය කිරීමේ ද්‍රව්‍ය | 25,577,383 | 52,575,012 |
| ඉන්ධන හා තෙල් | 2,202,542 | 2,985,371 |
| ලිපිද්‍රව්‍ය | 14,102,983 | 12,298,381 |
| **එකතුව** | **1,628,071,793** | **1,513,147,565** |

**12.1 තොග විශ්ලේෂණය**

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| රජයේ ඉඩම්වලින් ලද කඳන් | 1,121,806,209 | 937,127,446 |
| රජයේ ඉඩම්වලින් ලද ඉරුදැව | 294,030,658 | 243,774,881 |
| ආනයනික ඉරුදැව | 29,297,084 | 44,138,449 |
| පුද්ගලික ඉඩම්වලින් ලද කඳන් | - | 389,594 |
| රජයේ ඉඩම්වලින් ලද සිල්පර | 4,962,101 | 5,076,610 |
| පුද්ගලික ඉඩම්වලින් ලද සිල්පර | 20,830,501 | 8,701,121 |
| රජයේ ඉඩම්වලින් ලද විදුලිසම්ප්‍රේෂණ කණු | 30,609,100 | 27,271,525 |
| පුද්ගලික ඉඩම්වලින් ලද විදුලිසම්ප්‍රේෂණ කණු | 6,185,088 | 25,498,931 |
| වෙනත් | 8,735,650 | 28,536,736 |
| ගෘහභාණ්ඩ | 175,563,414 | 206,592,475 |
| **එකතුව** | **1,692,019,805** | **1,527,107,769** |

**13. වෙළඳ සහ වෙනත් ණයගැතියෝ**

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| වෙළඳ ණයගැතියෝ | 859,519,573 | 514,979,365 |
| අඩමාන ණය වෙන්කිරීම් | (162,500,334) | (80,400,519) |
| | **697,019,239** | **434,578,846** |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | 195,590,253 | 217,112,609 |
| වෙනත් ණයගැතියෝ | 24,616,170 | 46,917,602 |
| **තැන්පත් හා පූර්ව ගෙවීම්** | | |
| දේශීය මිලදීගැනීම් අත්තිකාරම් | 9,953,751 | 19,331,296 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් | 3,708,443 | 4,268,634 |
| දැව සැපයීමේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | 11,975,500 | 13,628,480 |
| තැන්පත් සඳහා ලැබිය යුතු පොලිය | 139,348,148 | 95,438,716 |
| ආපසු හරවා යැවූ චෙක්පත් | - | 1,385 |
| කතරගම අෂ්ඨඵල අරමුදල | 853,000 | 900,000 |
| උසාවි තැන්පත් | 8,778,248 | 8,778,248 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය | 1,661,488 | 1,661,488 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 31,333,242 | 25,785,621 |
| වරාය අධිකාරිය | 3,122,603 | - |
| **එකතුව** | **1,127,960,087** | **868,402,923** |



**13.1 වෙනත් ණයගැතියෝ**

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| විවිධ ණයගැතියෝ | 4,478,561 | 28,627,258 |
| පොදු තැන්පත් | 20,504,229 | 18,656,963 |
| වෙන් කිරීම් | (366,620) | (366,620) |
| **එකතුව** | **24,616,170** | **46,917,602** |

**13.2 කාර්ය මණ්ඩල ණයගැතියෝ**

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| **කාර්ය මණ්ඩල ණය** | | |
| වාහන ණය | 8,649,845 | 6,761,200 |
| ආපදා ණය | 143,957,200 | 164,575,656 |
| විදුලි උපකරණ ණය | 33,534 | 32,765 |
| යතුරුපැදි ණය | 1,544,597 | 1,121,884 |
| ලැප්ටොප් පරිගණක ණය | 22,114,834 | 21,922,972 |
| ගෘහභාණ්ඩ ණය | 2,085,607 | 947,924 |
| | **178,385,617** | **195,362,402** |
| **අත්තිකාරම් හා වෙනත් ණය** | | |
| වැටුප් හා වේතන අත්තිකාරම් | - | 2,000 |
| විශේෂ වැටුප් අත්තිකාරම් | 7,945,779 | 13,594,971 |
| ගමන් වියදම් අත්තිකාරම් | 51,488 | 15,827 |
| උත්සව අත්තිකාරම් | 3,818,625 | 3,876,495 |
| අභ්‍යන්තර හරපත් | 1,179,822 | 73,285 |
| සේවක අයකිරීම් | 472,365 | 452,226 |
| රෙදිපිළි ණය | 3,736,558 | 3,735,403 |
| | **17,204,637** | **21,750,207** |
| **එකතුව** | **195,590,253** | **217,112,609** |

### 14. මුදල් හා බැංකු ශේෂය

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| | | |
| අතැති මුදල් | 1,023,501 | 1,055,500 |
| මාර්ගස්ථ මුදල් | 2,857 | 24,791,076 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම | 74,020,661 | 47,421,508 |
| ලංකා බැංකුව - කාලීන තැන්පතු | 138,174,821 | 273,905,930 |
| **එකතුව** | **213,221,840** | **347,174,014** |

### 15. දායක ප්‍රාග්ධනය

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| | | |
| ශ්‍රී ලංකා රජයේ අරමුදල | 25,584,808 | 25,584,808 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරාගත් වත්කම් | 10,714,815 | 10,714,815 |
| ලෝක බැංකු ආධාර | 708,202 | 708,202 |
| කැනේඩියානු හා බ්‍රිතාන්‍ය ආධාර | 4,495,843 | 4,495,843 |
| **එකතුව** | **41,503,668** | **41,503,668** |

### 16. සේවක ණය චක්‍රීය අරමුදල

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| | | |
| වසර ආරම්භක ශේෂය | 332,062,529 | 243,052,926 |
| සේවක ණය පොළී ලැබීම් | 9,444,316 | 8,009,603 |
| මුදල් තැන්පත් කිරීම | - | 81,000,000 |
| **වසර අවසාන මුළු ශේෂය** | **341,506,845** | **332,062,529** |
| | | |
| දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත් අරමුදලේ නාමික අගය | 282,115,901 | 261,517,246 |
| **දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගත් අරමුදල** | **59,390,944** | **70,545,283** |

### 17. විශ්‍රාමික පාරිතෝෂිකය

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගයන් පහතින් දැක්වේ

| | | |
|---|---|---|
| වසර ආරම්භක ශේෂය | 788,350,624 | 438,573,892 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 36,694,460 | 41,973,758 |
| වසර සඳහා පොළිය | 85,581,902 | 39,364,743 |
| වර්ෂය තුළ ඌණතාවය හෝ (අතිරික්තය) | (107,601,910) | 323,413,595 |
| වර්ෂය තුළ ගෙවීම් | (58,532,507) | (54,975,364) |
| **වසර අවසාන ශේෂය** | **744,492,569** | **788,350,624** |

ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගයන් පහතින් දැක්වේ.

| | | |
|---|---|---|
| මෙම වසර සඳහා ප්‍රතිපාදන | 36,694,460 | 41,973,758 |
| වසර සඳහා පොළිය | 85,581,902 | 39,364,743 |
| **ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගය** | **122,276,362** | **81,338,501** |

විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා (අතිරික්තය) / ඌණතාවය | (107,601,910) | 323,413,595 |
| **විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගය** | **(107,601,910)** | **323,413,595** |

විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන වගකීම් ගණනයේ දී 1983 අංක 12 දරන විශ්‍රාමික පාරිතෝෂික පනතට අනුකූලව අඛණ්ඩව අවුරුදු 5කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. 2018 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන වගකීම් ආයු ගණනය කිරීම යටතේ ඇගයීමට ලක්කරන ලදී. වාර්තා කරනු ලබන දිනට ප්‍රධාන උපකල්පන,

| | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 11.88% | 10.28% |
| අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය | 12.54% | 13.12% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 3.64% | 5.72% |
| විශ්‍රාම ගැන්වීමේ වයස | 60 | 60 |

### 18. බදුකරණය

| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| | | |
| වසර ආරම්භක ගෙවිය යුතු ආදායම් බදු ශේෂය | 268,225,025 | 132,894,534 |
| තැන්පතු මත රඳවාගැනීමේ බදු | (11,529,679) | (15,948,065) |
| ආර්ථික සේවා ගාස්තු | (20,305,720) | (21,844,701) |
| වර්ෂය තුළ ගෙවීම් | (105,800,143) | (217,089,232) |
| බදු සඳහා ඌණ වෙන්කිරීම් | 244,282 | (314) |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | 230,724,261 | 390,212,803 |
| **වසර අවසාන ශේෂය** | **361,558,026** | **268,225,025** |

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අයකරගත යුතු ණයගැති ශේෂය වෙනුවට රාජ්‍ය දැව සංස්ථාව විසින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ආදායම් බදු වෙනුවෙන් හරස් සටහන් මගින් පියවීම සඳහා 2018.09.27 දින මිලියන 200ක මුදලක් මෙම ආයතන දෙක අතර මාරුකර දෙන ලෙස මහාභාණ්ඩාගාරයෙන් අනුමැතිය ඉල්ලා ඇත.

### 19. ණය හිමියෝ සහ උපචිත වියදම්

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| | | |
| සේවක අර්ථසාධක අරමුදල | 18,130,666 | 18,067,553 |
| සේවක භාරකාර අරමුදල | 2,175,680 | 2,141,317 |

| | | |
|---|---:|---:|
| උපචිත වියදම් | 87,073,813 | 130,272,172 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 7,783,104 | 11,590,240 |
| ඇප තැන්පත් - කාර්ය මණ්ඩලය හැර | 66,331,895 | 67,971,065 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 4,500,000 | 1,823,228 |
| රඳවාගත් මුදල් | 14,431,053 | 29,738,097 |
| වෙනත් ණයහිමියෝ | 44,386,460 | 63,191,276 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 379,911,392 | 587,972,172 |
| ස්කන්ධභාගය - වනජීවී දෙපාර්තමේන්තුව | 792,281 | 2,614,486 |
| ස්කන්ධභාගය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 722,648 | 722,648 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 9,580,200 | 7,184,941 |
| එකතුකළ අගය මත බදු | 50,290,933 | 43,201,698 |
| **එකතුව** | **686,110,124** | **966,490,894** |

## 20. ආශ්‍රිත පාර්ශවයන් සමඟ ගනුදෙනු

* රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වනසංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් සංස්ථාවට දැව හෙලීම සඳහා වනවගා නිදහස් කිරීමේදී ජාතික කළමනාකරණ සැලැස්මට අනුව සිදුකරන අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු විසින් රු.1,118,028,944/- වටිනා ගස් වර්ෂය තුළ දී සංස්ථාවට ලබා දී ඇත.

* රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට අයත් බිම් කොටසක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ESCAM ව්‍යාපෘතිය සඳහා බදු දී ඇත. රාජ්‍ය දැව සංස්ථාව එම ආයතනයන් පාවිච්චි කරන ලද භූමි ප්‍රමාණයන් අනුව කුළී ආදායම් ගණනය කර ඇත.

| | වර්ග අඩි ගණන | කුළී මුදල (රු.) |
|---|---:|---:|
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 22,040 | 550,000.00 |
| ESCAMP ව්‍යාපෘතිය | 5,649 | 300,000.00 |
| | | |

මූල්‍ය ප්‍රකාශන දිනයට ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනුවල ශේෂයන් පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනට | 2018<br>රු. | 2017<br>රු. |
|---|---:|---:|
| | | |
| **ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු** | | |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 379,911,392 | 587,972,172 |
| | **379,911,392** | **587,972,172** |
| **ආශ්‍රිත පාර්ශවයනගෙන් ලැබිය යුතු** | | |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 31,333,242 | 25,785,621 |
| පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යංශය | 1,661,488 | 1,661,488 |
| | **32,994,730** | **27,447,108** |



# මූල්‍ය පරිභාෂික ශබ්ද මාලාව

1. **ගිණුම් ප්‍රතිපත්ති**
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී භාවිතා කරනු ලබන විශේෂ මූලධර්ම, පදනම්, සම්මත, නීතීන් සහ ක්‍රියාමාර්ග.

2. **ක්‍රමක්ෂය**
අස්පෘශ්‍ය වත්කම් එහි ඵලදායී ජීව කාලය තුල ක්‍රමවත් ලෙස බෙදා හැරීම.

3. **උපචිත වියදම්**
ආදායම් හා වියදම් ලැබීම් හෝ ගෙවීම් කාලපරිච්ඡේදයන් ගැන නොසලකා, එකිනෙක ගැලපීමේ මූලධර්මය.

4. **මුදල් හා මුදල් වලට සමාන වත්කම්**
මාස 3 ක් හෝ ඊට අඩු කාලයකින් කල්පිරෙන ද්‍රවශීලි ආයෝජන.

5. **ආදායම් සංචිත**
ආයෝජන සඳහා තබා ඇති සංචිත.

6. **අගය එකතු කිරීම්**
සංස්ථාව විසින් එහි ක්‍රියාකාරකම් මත උත්පාදනය කරන ලද ධන ප්‍රමාණය.

7. **ක්‍රියාකාරී දර්ශකය**
ජංගම වගකීම් වලින් ජංගම වත්කම් බෙදූ විට ලැබේ.

8. **ක්ෂය වීම්**
වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ඵලදායී ජීවකාලය තුල ක්‍රමවත්ව බෙදාහැරීම.

9. **තෝලනය**
යෙදවූ ප්‍රාග්ධනයට ණය ලබාගත් ප්‍රමාණය.

10. **සාධාරණ අගය**
දැනුමැති මනාප පාර්ශවයන් අතර අතේ දුරින් කරනු ලබන ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කලහැකි අගය වේ.

11. **වත්කම් මත ඉපැයීම්**
ශුද්ධ ආදායම මුළු වත්කමෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි. මෙය ලාභය මැනීමේ හා සමාන වෙනත් ආයතනවල කාර්යසාධනය සැසඳීමේ මිනුමක් ලෙස භාවිතාවේ.

12. **විලම්භිත බදු**
වර්තමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්ති වලින් වෙනස් වීම නිසා අනාගතයේදී ඇති විය හැකි වත්කම් හෝ වගකීම් වේ.

1968 - 2018
සංවත්සරය
50 Anniversary
රාජ්‍ය දැව සංස්ථාව • STATE TIMBER CORPORATION

*Anyone who sees the name State Timber Corporation can understand easily its relationship with timber. With 50 years of experience and commitment, the service rendered to the country and to its loved employees cannot be explained. Despite all these years, the State Timber Corporation is a treasured example for other government entities to run their businesses successfully without being a burden to the Sri Lankan government.*

*Needless to say, the management of the corporation and all the employees by their generous contribution towards corporation has helped them to move for the victory amidst various obstacles and dilemmas. The primary objectives are to carefully cut and remove our valuable "trees" in a more responsible and environmentally friendly manner, and to make various designs and shapes to the best use of available timber to meet the timber needs of the people.*

*The State Timber Corporation is marking another milestone in its 50th anniversary with the determination to serve the people for a long time and to serve the country as well.*

**රාජ්‍ය දැව සංස්ථාව**


අංක. 82, "සම්පත්පාය", රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකා.
Telephone : +94 11 2866601 - 5 | Fax : +94 11 2866623 | E-mail : stcfur@gmail.com | Web : www.timco.lk


PRINTEC | 0112 815 816